# පටිපාටිගත සුරක්ෂිතතා දැන්වීම

අවසන් යාවත්කාලීන කිරීම: 10/16/18

*සැලකිය යුතුයි: මෙම ලේඛනය මිචිගන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලබා ගැනීම පිළිබඳ ප්‍රමිතීන්ට අනුකූලව යාවත්කාලීන කර ඇත. අඩංගු කරුණු වල වෙනසක් සිදු කර නොමැත.*

MICHIGAN Department of Education

මිචිගන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විශේෂ අධ්‍යාපනය පිළිබඳ කාර්යාලය

**අධ්‍යාපනය පිළිබඳ ප්‍රාන්ත මණ්ඩලය**

කැසැන්ඩ්‍රා ඊ. උල්බ්‍රිච්, සම-සභාපති
රිචර්ඩ් සෙයිල් සම-සභාපති
මිෂෙල් ෆෙක්ටූ, ලේකම්
ටොම් මැක්මිලින්, භාණ්ඩාගාරික
නිකී ස්නයිඩර්, අධ්‍යාපනය පිළිබඳ ප්‍රාන්ත මණ්ඩල වල ජාතික සම්මේලනයේ [*National Association of State Boards of Education (NASBE)*] නියෝජිත
පැමෙලා පූ
ලූපේ රාමෝස්-මොන්ටිග්නි
අයිලීන් ලැපින් වයිසර්

**නිල බලයෙන්**

රික් ස්නයිඩර්, ආණ්ඩුකාර
ශීලා ඒ. අලස්, තාවකාලික ප්‍රාන්ත අධ්‍යක්ෂක


**මිචිගන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව *[Michigan Department of Education (MDE)]***
විශේෂ අධ්‍යාපනය පිළිබඳ කාර්යාලය
*608 West Allegan Street*
*P.O. Box 30008*
*Lansing, MI 48909*
*517-241-7075*
*MDE* වෙබ්අඩවිය (www.michigan.gov/mde)

ආබාධිත ශිෂ්‍යන්ගේ අධ්‍යාපනය පිළිබඳ ෆෙඩරල් නීතිය වන ආබාධ සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපන පනත [*Individuals with Disabilities Education Act (IDEA)*] මගින්, ආබාධිත තත්වයක් සහිත දරුවෙකුගේ දෙමව්පියන් හට *IDEA* සහ *U.S.* [*United States* - එක්සත් ජනපද] අධ්‍යාපන දෙපාර්තමේන්තු රෙගුලාසි වලට යටත්ව ඇති පටිපාටිගත සුරක්ෂිතතාවයන් පිළිබඳ සම්පූර්ණ පහදා දීමක් සහිත දැන්වීමක් පාසල මගින් ලබා දීමට නියම කර ඇත. පාසල් වසරකට එක් වරක් පමණක් මෙම දැන්වීමේ පිටපතක් ලබා දිය යුතු අතර, ඊට අමතරව: (1) මුලින්ම යොමු කරන අවස්ථාවේ දී හෝ දෙමව්පියන් විසින් තක්සේරුවකට ලක් කරන ලෙස ඉල්ලා සිටින අවස්ථාවක දී; (2) පාසල් වසරකදී 34 *CFR* [*Code of Federal Regulations* - ෆෙඩරල් රෙගුලාසි කේත අංක] §§300.151 සිට 300.153 දක්වා අදාළ වන ප්‍රථම ප්‍රාන්ත පැමිණිල්ල ලැබුණු අවස්ථාවේ දී සහ §300.507 යටතේ වන අදාළ ක්‍රියාවලි සඳහා වන ප්‍රථම පැමිණිල්ල ලැබුණු අවස්ථාවේ දී; (3) ස්ථානයේ වෙනසක් සිදු කිරීමට නියම විය හැකි විනය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරනු ලබන අවස්ථාවක දී; සහ(4) දෙමව්පියන් විසින් ඉල්ලා සිටින අවස්ථාවක දී ද ලබා දිය යුතු වේ. [34 *CFR* §300.504(a)]

මෙම පටිපාටිගත සුරක්ෂිතතා දැන්වීමෙහි §300.148 (මහජන වියදමින් පෞද්ගලික පාසලක ඒකපාර්ශවිකව ස්ථානගත කිරීම) යටතේ, §§300.151 සිට 300.153 දක්වා (ප්‍රාන්ත පැමිණිලි ක්‍රියාවලි) වන කේත යටතේ, §300.300 (නිසි අවසරය) යටතේ, §§300.502 සිට 300.503 දක්වා, §§300.505 සිට 300.518 දක්වා, සහ §§300.530 සිට 300.536 දක්වා (බී කොටසේ රෙගුලාසි වල අඩංගු ඊ අනු කොටසේ ඇති පටිපාටිගත සුරක්ෂිතතා) වන කේත යටතේ, සහ §§300.610 සිට 300.625 දක්වා (එෆ් අනු කොටසේ ඇති තොරතුරු වල රහසිගතභාවය පිළිබඳ ප්‍රතිපාදන) වන කේත යටතේ ඇති සියලු පටිපාටිගත සුරක්ෂිතතා පිළිබඳ සම්පූර්ණ පහදා දීමක් අඩංගු විය යුතුය.

මෙම පත්‍රිකාවේ පහත සඳහන් කෙටි යෙදුම් භාවිතා වේ:

| | |
|---|---|
| *ALJ* | පරිපාලන නීති විනිසුරුවරයා *[Administrative Law Judge]* |
| *BIP* | චර්යා රටා සඳහා මැදිහත්වීමේ සැලසුම *[Behavioral Intervention Plan]* |
| *FAPE* | නිදහස් නිසි පොදු අධ්‍යාපනය *[Free Appropriate Public Education]* |
| *FERPA* | පවුල් අධ්‍යාපන හිමිකම් සහ පුද්ගලිකත්ව පනත *[Family Educational Rights and Privacy Act]* |
| *FBA* | ක්‍රියාකාරී චර්යා රටා ඇගැයුම *[Functional Behavioral Assessment]* |
| *IDEA* | ආබාධ සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපන පනත *[Individuals with Disabilities Education Act]* |
| *IEE* | ස්වාධීන අධ්‍යාපනික තක්සේරුව *[Independent Educational Evaluation]* |
| *IEP* | පුද්ගලබද්ධ අධ්‍යාපනික වැඩසටහන *[Individualized Education Program]* |
| *MDE* | මිචිගන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව *[Michigan Department of Education]* |
| *OSE* | විශේෂ අධ්‍යාපනය පිළිබඳ කාර්යාලය *[Office of Special Education]* |
| *SOAHR* | පරිපාලන නීති සහ විභාග කිරීම් පිළිබඳ කාර්යාලය *[State Office of Administrative Hearings and Rules]* |

# පටුන


පටිපාටිගත සුරක්ෂිතතා දැන්වීම ........ 11
සාමාන්‍ය තොරතුරු ........ 11
පූර්ව ලිඛිත දැනුම් දීම ........ 11
34 *CFR* §300.503 ........ 11
දැන්වීම ........ 11
දැන්වීමේ අඩංගු කරුණු ........ 11
පුද්ගලබද්ධ අධ්‍යාපනික වැඩසටහන දැන්වීමක් ලෙස භාවිතා කිරීම ........ 11
තේරුම්ගත හැකි පහසු භාෂාවකින් දැන්වීම ........ 11
මව්බස ........ 12
34 *CFR* §300.29 ........ 12
විද්‍යුත් තැපෑල ........ 12
34 *CFR* §300.505 ........ 12
දෙමව්පියන්ගේ නිසි අවසරය - අර්ථ දැක්වීම ........ 12
34 *CFR* §300.9 ........ 12
නිසි අවසරය ........ 12
දෙමව්පියන්ගේ නිසි අවසරය ........ 13
34 *CFR* §300.300 ........ 13
මූලික තක්සේරුව සඳහා නිසි අවසරය ........ 13
ජ්‍රාන්තයේ ආරක්ෂිතයින් ගේ මූලික තක්සේරුව පිළිබඳ විශේෂ නීති ........ 13
සේවා සඳහා අදාළ දෙමව්පියන්ගේ නිසි අවසරය ........ 14
දෙමව්පියන්ගේ නිසි අවසරය අවලංගු කිරීම ........ 14
නැවත තක්සේරු කිරීම් හා අදාළ දෙමව්පියන්ගේ නිසි අවසරය ........ 15
දෙමව්පියන්ගේ නිසි අවසරය ලබා ගැනීමට අදාළ සාධාරණ වෑයම ලේඛනගත කිරීම ........ 15
නිසි අවසරය හා අදාළ අනෙකුත් අවශ්‍යතා ........ 15
ස්වාධීන අධ්‍යාපනික තක්සේරු ........ 16
34 *CFR* §300.502 ........ 16
සාමාන්‍ය ........ 16

අර්ථ දැක්වීම් ........ 16

මහජන වියදමින් තක්සේරුව කිරීමට දෙමව්පියන්ට ඇති හිමිකම ........ 16

දෙමව්පියන් විසින් සිදු කරනු ලබන තක්සේරු ........ 17

පරිපාලන නීති විනිසුරුවරයෙකු විසින් සිදු කරනු ලබන තක්සේරු සඳහා වන ඉල්ලීම් ........ 17

පාසල් දිස්ත්රික්ක නිර්ණායක ........ 17

තොරතුරු වල රහස්යභාවය ........ 18

අර්ථ දැක්වීම් ........ 18

34 *CFR* §300.611 ........ 18

පෞද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු ........ 18

34 *CFR* §300.32 ........ 18

දෙමව්පියන් වෙත කෙරෙන දැන්වීම ........ 18

34 *CFR* §300.612 ........ 18

ප්රවේශ අයිතීන් ........ 19

34 *CFR* §300.613 ........ 19

ප්රවේශය පිලිබඳ වාර්තාව ........ 19

34 *CFR* §300.614 ........ 19

එක් දරුවෙකුට වඩා වැඩි ගණනක් පිලිබඳ වාර්තා ........ 19

34 *CFR* §300.615 ........ 19

තොරතුරු වර්ග හා පිහිටි ස්ථාන පිලිබඳ ලැයිස්තුව ........ 20

34 *CFR* §300.616 ........ 20

ගාස්තු ........ 20

34 *CFR* §300.617 ........ 20

දෙමාපියන්ගේ ඉල්ලීම මත වාර්තා සංශෝධනය කිරීම ........ 20

34 *CFR* §300.618 ........ 20

නඩු විභාගයකට අවස්ථාවක් ........ 20

34 *CFR* §300.619 ........ 20

විභාග කිරීම් ........ 20

34 *CFR* §300.621 ........ 20

නඩු විභාගයේ ප්රතිඵල ........ 21

34 *CFR* §300.620 ... 21

පෞද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු අනාවරණය කිරීම සඳහා නිසි අවසරය ... 21

34 *CFR* §300.622 ... 21

සුරක්ෂිතතාවන් ... 21

34 *CFR* §300.623 ... 21

තොරතුරු වල විනාශය ... 22

34 *CFR* §300.624 ... 22

ශිෂ්‍ය අයිතිවාසිකම් ... 22

34 *CFR* §300.625 ... 22

මැදිහත්වීම ... 22

මැදිහත්වීම ... 22

34 *CFR* §300.506 ... 22

සාමාන්‍ය ... 22

අවශ්‍යතා ... 22

මැදිහත්කරුගේ අපක්ෂපාතීත්වය ... 23

ප්‍රාන්ත පැමිණිලි ක්‍රියාවලි ... 25

අදාළ ක්‍රියාවලිය පිළිබඳව පැමිණිලි කිරීම හා විභාග කිරීමේ සහ ප්‍රාන්ත පැමිණිලි ක්‍රියාවලි අතර වෙනස්කම් ... 25

හදාවඩා ගැනීම සම්බන්ධව ප්‍රාන්ත පැමිණිලි ක්‍රියාවලි ... 25

34 *CFR* §300.151 ... 25

සාමාන්‍ය ... 25

සුදුසු සේවා ප්‍රතික්ෂේප වීම සම්බන්ධව පිළියම් ... 25

ප්‍රාන්ත පැමිණිලි ක්‍රියාවලියේ අවම ක්‍රියාපටිපාටිය ... 26

34 *CFR* §300.152 ... 26

කාලසීමාව¦ අවම ක්‍රියාපටිපාටිය ... 26

කාලය දීර්ඝ කිරීම¦ අවසාන තීන්දුව¦ ක්‍රියාත්මක කිරීම ... 26

රජයේ පැමිණිලි සහ නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාග කිරීම් ... 26

රජයේ පැමිණිලි ඉදිරිපත් කිරීම ... 27

34 *CFR* §300.153 ... 27

අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල කිරීමේ පරිපාටිය ........ 28
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල ගොනු කිරීම ........ 28
34 *CFR* §300.507 ........ 28
සාමාන්‍ය ........ 28
දෙමාපියන් සඳහා තොරතුරු ........ 28
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල ........ 28
34 *CFR* §300.508 ........ 28
සාමාන්‍ය ........ 28
පැමිණිල්ලේ අන්තර්ගතය ........ 28
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් විභාග කිරීමට පෙර දැනුම් දීමක් අවශ්‍ය ය ........ 29
පැමිණිල්ල ප්‍රමාණවත් වීම ........ 29
පැමිණිල්ල සංශෝධනය කිරීම ........ 29
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් සඳහා පාසල් දිස්ත්‍රික්කය මගින් ලබාදෙන ප්‍රතිචාරය ... 29
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල සඳහා වෙනත් පාර්ශවයේ ප්‍රතිචාරයන් ........ 30
ආදර්ශ ආකෘති අයදුම්පත් පත්‍රය ........ 30
34 *CFR* §300.509 ........ 30
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් කිරීම සහ විභාගය කිරීම පවත්වන අතරතුර දරුවාගේ ස්ථානගත කිරීම ........ 30
34 *CFR* §300.518 ........ 30
විසඳුම් ක්‍රියාවලිය ........ 31
34 *CFR* §300.510 ........ 31
විසඳුම් සඳහා වන හමුවීම ........ 31
යෝජනා ඉදිරිපත් කිරීමේ කාලය ........ 31
දින දර්ශනයේ දින 30ක විසඳීමේ කාලයෙහි වෙනස් කිරීම ........ 32
නිරවුල් කිරීමේ ලිඛිත ගිවිසුම ........ 32
ගිවිසුම සමාලෝචන කිරීමේ කාලය ........ 32
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිලි සම්බන්ධ නඩු විභාගය ........ 33
අපක්ෂපාතී අදාළ ක්‍රියාවලි සඳහා වන විභාග කිරීම් ........ 33

34 *CFR* §300.511 ... 33
සාමාන්‍ය ... 33
අපක්ෂපාතී පරිපාලන නීති විනිසුරුවරයා ... 33
අදාළ ක්‍රියාවලි සම්බන්ධ නඩු විභාගයේ විෂය කරුණු ... 33
නඩු විභාගයක් ඉල්ලා සිටීමේ කාල සීමාව ... 33
කාලසීමාවට පටහැනි අවස්ථා ... 33
නඩු විභාග අයිතීන් ... 34
34 *CFR* §300.512 ... 34
සාමාන්‍ය ... 34
අතිරේක තොරතුරු අනාවරණය කිරීම ... 34
නඩු විභාගයේදී දෙමාපිය අයිතීන් ... 34
නඩු විභාග තීරණ ... 34
34 *CFR* §300.513 ... 34
පරිපාලන නීති විනිසුරුවරයාගේ තීරණ ... 34
අන්තර් වාක්‍ය විග්‍රහය ... 35
අදාළ ක්‍රියාවලි සම්බන්ධ නඩු විභාගයක් සඳහා වෙනම ඉල්ලීමක් කිරීම ... 35
උපදේශන මණ්ඩලයට සහ සාමාන්‍ය මහජනතාවට සොයාගැනීම් සහ තීරණ දැනුම් දීම ... 35
අභියාචනා ... 36
අවසාන තීන්දුව¦ අභියාචනය¦ සාධාරණ විචාරය ... 36
34 *CFR* §300.514 ... 36
අවසාන නඩු තීන්දුව ... 36
නඩු විභාගයේ කාලසීමාව සහ අවකාශය ... 36
34 *CFR* §300.515 ... 36
සිවිල් ක්‍රියා, එම ක්‍රියා ගොණු කිරීමට කාල පරිච්ඡේදය ඇතුළත් කිරීම ... 36
34 *CFR* §300.516 ... 36
සාමාන්‍ය ... 36
කාලයේ සීමිත බව ... 36
අතිරේක විධික්‍රම ... 36

දිස්ත්‍රික් උසාවි වල අධිකරණ බලය ........ 37
ගොඩනැංවීමේ නීතිය ........ 37
නීතිඥ ගාස්තු ........ 37
34 *CFR* §300.517 ........ 37
සාමාන්‍ය ........ 37
ගාස්තු ප්‍රධානය ........ 38
ආබාධ සහිත දරුවන් හික්මවීමේ දී ක්‍රියා පිළිවෙල ........ 39
පාසල් කාර්ය මණ්ඩලයේ බලතල ........ 39
34 *CFR* §300.530 ........ 39
අවස්ථාවෙන් අවස්ථාව නිර්ණය කිරීම ........ 39
සාමාන්‍ය ........ 39
අතිරේක අධිකාරය ........ 39
සේවාවන් ........ 39
විද්‍යාමානවීම නිර්ණය ........ 40
හැසිරීම, දරුවාගේ ආබාධිත තත්වය විද්‍යාමානවීමක් බව නිර්නය කිරීම ........ 41
විශේෂ අවස්ථා ........ 41
අර්ථ දැක්වීම් ........ 41
නිවේදනය ........ 41
විනයානුකූල ඉවත් කිරීම් නිසා සිදු වන ස්ථානයේ වෙනසක් ........ 42
34 *CFR* §300.536 ........ 42
පසුබිම තීරණය කිරීම ........ 42
34 *CFR* § 300.531 ........ 42
අභියාචනය ........ 42
34 *CFR* § 300.532 ........ 42
සාමාන්‍ය ........ 42
පරිපාලන නීති විනිසුරු අධිකාරිය ........ 43
අභියාචනා අතරතුරදී ස්ථානගත කිරීම ........ 43
34 *CFR* §300.533 ........ 43

දරුවන්ට ආරක්ෂාව, විශේෂ අධ්‍යාපන හා අදාළ සේවා සඳහා සුදුසුකමක් නොවේ.............................. 43
34 *CFR* §300.534.................................................................................................................. 43
සාමාන්‍ය ........................................................................................................................... 43
විනය කටයුතු සඳහා අදාළ වන දැනුම් පදනම ....................................................................... 44
ව්‍යතිරේකය........................................................................................................................ 44
දැනුම් පදනමක් නොමැති නම් අදාළ වන කොන්දේසි............................................................. 44
පොලීසිය සහ අධිකරණ බලධාරීන් විසින් යොමු කිරීම හා ක්‍රියා කිරීම .............................................. 45
34 *CFR* §300.535.................................................................................................................. 45
වාර්තා සම්ප්‍රේෂණය කිරීම......................................................................................................... 45
මහජන වියදමින් පෞද්ගලික පාසල්වල දරුවන්ගේ දෙමව්පියන් විසින් ඒකපාර්ශවිකව ස්ථානගත කිරීම් සඳහා වන අවශ්‍යතා ........................................................................................................................ 46
සාමාන්‍ය........................................................................................................................... 46
34 *CFR* §300.148.................................................................................................................. 46
පෞද්ගලික පාසල් ස්ථාපනය සඳහා ප්‍රතිපූරණ දීමනාව........................................................ 46
ප්‍රතිපූරණ සීමා කිරීම ........................................................................................................ 46
වයොපූර්ණත්වයේ දී පරම අයිතිය හුවමාරු කිරීම......................................................................... 47
34 *CFR* §300.520.................................................................................................................. 47
ඇමුණුම් ඒ - ෆෙඩරල් අර්ථ දැක්වීම් .............................................................................................. 48
බරපතළ තුවාල ............................................................................................................................ 48
18 USC 1365(*h*) ........................................................................................................................ 48
ආයුධය........................................................................................................................................ 48

# පටිපාටිගත සුරක්ෂිතතා දැන්වීම

## සාමාන්‍ය තොරතුරු

### පූර්ව ලිඛිත දැනුම් දීම

**34 *CFR* §300.503**

දැන්වීම

ඔබගේ පාසල් දිස්ත්‍රික්කය (මෙම දැන්වීම් සඳහන් ―පාසල් දිස්ත්‍රික්කය˜ යන යෙදුමට පොදු පාසල් ඇකඩමි ද අඩංගු වේ) විසින් පහත සඳහන් සෑම විටෙකම ඔබට ලිඛිත දැනුම්දීමක් (ලියමනක් ලෙස තොරතුරු ලබා දීමක්) කළ යුතු වේ:

1. ඔබගේ දරුවාගේ හැඳුනුම, තක්සේරුව හෝ අධ්‍යාපනික ස්ථාපිත කිරීම, හෝ ඔබගේ දරුවාට නිදහස් නිසි පොදු අධ්‍යාපනයක් [*Free Appropriate Public Education (FAPE)*] ප්‍රතිපාදනය ආරම්භ කිරීමට හෝ වෙනස් කිරීමට යෝජනා කරන අවස්ථාවක දී¦ හෝ
2. ඔබගේ දරුවාගේ හැඳුනුම, තක්සේරුව හෝ අධ්‍යාපනික ස්ථාපිත කිරීම, හෝ ඔබගේ දරුවාට *FAPE* ප්‍රතිපාදනය ආරම්භ කිරීමට හෝ වෙනස් කිරීමට ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී.

දැන්වීමේ අඩංගු කරුණු

ලිඛිත දැන්වීම මගින්:

1. ඔබගේ පාසල් දිස්ත්‍රික්කය මගින් සිදු කිරීමට යෝජනා කරන හෝ ප්‍රතික්ෂේප කරන ක්‍රියාවන් පැහැදිලි කළ යුතු වේ¦
2. එම ක්‍රියාවන් සිදු කිරීම යෝජනා කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හේතු පැහැදිලි කළ යුතු වේ¦
3. එම ක්‍රියාවන් සිදු කිරීමට හෝ යෝජනා කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට තීරණය කිරීමට හේතු වූ එක් එක් ඇගයීම් ක්‍රියාවලිය, ඇගැයුම, සටහන් සහ රපොර්තු පත පිළිබඳ පැහැදිලි කළ යුතු වේ¦
4. *IDEA* හි බී කොටසේ පටිපාටිගත සුරක්ෂිතතා ප්‍රතිපාදන යටතේ ඔබ ආරක්ෂා වන බවට ප්‍රකාශය ක් අඩංගු විය යුතු වේ¦
5. ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් යෝජනා කරන හෝ ප්‍රතික්ෂේප කරන ක්‍රියාවන් තක්සේරුවකට අදාළ මූලික යොමු කිරීමක් නොවේ නම්, පටිපාටිගත සුරක්ෂිතතා විස්තරයක් ලබා ගන්නා ආකාරය පැවසිය යුතු වේ¦
6. *IDEA* හි බී කොටස තේරුම්ගැනීමට අවශ්‍ය උදව් ලබා ගැනීමට සම්බන්ධ කර ගත යුතු අයගේ විස්තර ඇතුලත් කළ යුතු වේ¦
7. ඔබගේ දරුවාගේ පුද්ගලබද්ධ අධ්‍යාපනික වැඩසටහන් [*Individualized Education Program (IEP)*] කණ්ඩායම සලකනු ලැබූ අනෙක් විකල්ප සහ එම විකල්ප ප්‍රතික්ෂේප වූ හේතු විස්තර කළ යුතු වේ¦ සහ
8. ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් එම ක්‍රියාවන් සිදු කිරීමට යෝජනා කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ වෙනත් හේතු පිළිබඳ විස්තරයක් ලබා දිය යුතු වේ.

පුද්ගලබද්ධ අධ්‍යාපනික වැඩසටහන දැන්වීමක් ලෙස භාවිතා කිරීම

§300.503 හි අඩංගු සියලු කරුණු දෙමව්පියන්ට හිමි වන ලියකියවිල්ල/ලියකියවිලි මගින් සපුරාලන තාක්, පොදු ඒජන්සියකට *IEP* යන්න ලිඛිත පෙර දැනුම්දීමක් ලෙස භාවිත කළ හැකිය.

තේරුම්ගත හැකි පහසු භාෂාවකින් දැන්වීම

මෙම දැන්වීම:

1. සාමාන්‍ය ජනතාවට තේරුම් ගත හැකි පහසු භාෂා ව්‍යවහාරයකින් ලියවිය යුතු වේ¦ සහ
2. පැහැදිලි ලෙසම කළ නොහැකි අවස්ථාවක විනා, ඔබගේ මව්බසින් හෝ ඔබ භාවිතා කරන වෙනත් සන්නිවේදන ක්‍රමයකට ලබා දිය යුතු වේ.

ඔබගේ මව්බස හෝ ඔබ භාවිතා කරන වෙනත් සන්නිවේදන ක්‍රමය ලිඛිත භාෂාවක් නොවේ නම්, ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින්:

1. මෙම දැන්වීම වාචිකව වෙනයම් ආකාරයකට ඔබගේ මව්බසින් හෝ වෙනත් සන්නිවේදන ක්‍රමයකින් ඔබට පරිවර්තනය කළ යුතු බවට වග බලා ගත යුතු වේ¦
2. ඔබ දැන්වීමේ අඩංගු කරුණු තේරුම් ගන්නා බවට වග බලා ගත යුතු වේ¦ සහ
3. ඉහත 1 හා 2 කරුණු සපිරුණු බවට ලිඛිත සාක්ෂි ඇති බවට වග බලා ගත යුතු වේ.

**මව්බස**

**34 *CFR* §300.29**
සීමාසහිත ඉංග්‍රීසි දැනුමක් සහිත පුද්ගලයෙකු හා අදාලව —මව්බස˜ යන වචනය භාවිතයේ දී, එහි අදහස පහත පරිදි වේ:

1. එය අදාළ පුද්ගලයා විසින් සාමාන්‍යයෙන් භාවිතා කරන භාෂාව හෝ, දරුවෙකුට අදාළව, එම දරුවාගේ දෙමව්පියන් විසින් භාවිතා කරන භාෂාව වේ¦
2. දරුවා සමග සිදු කරන ඍජු ගනුදෙනු වලදී (දරුවාගේ තක්සේරු කටයුතු ද ඇතුළත්ව), දරුවා විසින් සාමාන්‍යයෙන් නිවසේ දී හෝ ඉගෙනුම ලබන පරිසරයේදී භාවිතා කරන භාෂාව.

බිහිරි හෝ අන්ධ පුද්ගලයෙකුට හෝ, ලිඛිත භාෂාවක් නොමැති පුද්ගලයෙකුට සන්නිවේදන මාර්ගය වනුයේ එම පුද්ගලයා විසින් සාමාන්‍යයෙන් භාවිතා කරන සන්නිවේදන මාර්ගයයි (සංඥා භාෂාව, බ්‍රේල්, හෝ වාචික සන්නිවේදනය ආදිය).

**විද්‍යුත් තැපෑල**

**34 *CFR* §300.505**
ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් ඔබට ලියකියවිලි විද්‍යුත් තැපෑල මගින් ලබා ගැනීමේ අවස්ථාව ලබා දේ නම්, පහත සඳහන් දෑ විද්‍යුත් ලිපි මගින් ඔබට ලබා ගත හැකිය:

1. ලිඛිත පෙර දැනුම්දීම¦
2. පටිපාටිගත සුරක්ෂිතතා දැන්වීම¦ සහ
3. අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක දැන්වීම්.

**දෙමව්පියන්ගේ නිසි අවසරය - අර්ථ දැක්වීම**

**34 *CFR* §300.9**

නිසි අවසරය
නිසි අවසරය යනු:

1. ඔබ නිසි අවසරය ලබා දෙන ක්‍රියාව පිළිබඳව ඔබගේ මව්බසින් හෝ වෙනයම් සන්නිවේදන මාර්ගයකින් (සංඥා භාෂාව, බ්‍රේල්, වාචික සන්නිවේදනය ආදී ලෙස) ඔබට සියලු තොරතුරු ලබා දී ඔබව සම්පූර්ණයෙන් දැනුවත් කර ඇත.

2. එම ක්‍රියාව ඔබ තේරුම්ගෙන ලිඛිතව එකඟ වී ඇති අතර, අදාළ නිසි අවසරයෙන් එම ක්‍රියාව විස්තර කර කිරීම සහ ඉන් පසු නිකුත් කරනු ලබන අදාළ සටහන් (තිබේ නම්) ලැයිස්තු ගත කර, කා හට නිකුත් කෙරේද යන්න ද සඳහන් කර ඇත¦ සහ
3. නිසි අවසරය ඔබගේ ස්වකැමැත්ත පරිදි වන බවට ඔබ අවබෝධ කරගෙන ඇති අතර, ඕනෑම අවස්ථාවක දී ලබා දුන් නිසි අවසරය ආපසු ගැනීමට හැකියාව ඇත.

නිසි අවසරය ආපසු ගැනීම නිසා, නිසි අවසරය දීම සහ එය නැවත ගැනීම අතර කාලයේ සිදු වූ ක්‍රියාවලි නිශේධනය වීමක් (බල රහිත වීමක්) සිදු නොවේ.

**දෙමව්පියන්ගේ නිසි අවසරය**

**34 *CFR* §300.300**

මූලික තක්සේරුව සඳහා නිසි අවසරය
යෝජනා කරන ක්‍රියාවලිය පිළිබඳව ඔබට ලිඛිත පෙර දැනුම්දීමක් සිදු නොකර හෝ ඉහත **දෙමව්පියන්ගේ නිසි අවසරය - අර්ථ දැක්වීම** යන කොටස යටතේ විස්තර කළ පරිදි ඔබගේ නිසි අවසරය රහිතව, *IDEA* හි බී කොටස යටතේ ඔබගේ දරුවා විශේෂ අධ්‍යාපනය සහ ඒ හා අදාළ අනෙක් සේවයන්ට සුදුසුකම් ලබන්නේද යන්න නිර්ණය කිරීමට ඔබගේ පාසල් දිස්ත්‍රික්කයට මූලික තක්සේරුවක් සිදු කළ නොහැක.

ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් ඔබගේ දරුවා ආබාධිත දරුවෙක්ද යන්න තීරණය කිරීම සඳහා සිදු කරන මූලික තක්සේරුවකට ඔබව දැනුවත් කර නිසි අවසරය ලබා ගැනීම සඳහා සාධාරණ වෑයමක් දැරිය යුතුය.

ඔබ විසින් මූලික තක්සේරුව සඳහා අවසරය ලබා දීමෙන්, ඔබගේ දරුවා හට විශේෂ අධ්‍යාපනය සහ ඒ හා අදාළ සේවා සැපයීමට ද ඔබ විසින් පාසල් දිස්ත්‍රික්කයට නිසි අවසරය ලබා දුන් බවක් අදහස් වන්නේ *නැත*.

ඔබගේ දරුවා පොදු පාසලකට ඇතුලත් කර ඇති විටෙක හෝ පොදු පාසලකට ඇතුලත් කිරීමට බලාපොරොත්තු වන විටෙක සහ ඔබ විසින් මූලික තක්සේරුවකට නිසි අවසරය ලබා දීමට ප්‍රතික්ෂේප කර ඇති විටෙක හෝ එවැනි තක්සේරුවක් සඳහා සිදු කළ ඉල්ලීමකට ප්‍රතිචාර නොදැක්වූ විටෙක, ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් පනතේ මැදිහත්වීම හෝ අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිලි, විසඳුම් සඳහා වන හමුවීම්, අපක්ෂපාතී අදාළ ක්‍රියාවලි සඳහා වන විභාග කිරීම් යන කරුණු වලට යටත්ව, අත්‍යාවශ්‍ය නොවුවත්, ඔබගේ දරුවාගේ මූලික තක්සේරුවක් සිදු කිරීමට උත්සාහ දරනු ඇත. මෙම තත්ත්ව යටතේ දී ඔබගේ දරුවාගේ තක්සේරුවක් සිදු කිරීමට උත්සාහයක් නොදරනු ලබයි නම්, ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් ඔබගේ දරුවා සිටින ස්ථානය, හැඳුනුම සහ තක්සේරුවට අදාලව ඔවුන්ගේ බැඳීම් උල්ලංඝණය නොකරනු ඇත.

ප්‍රාන්තයේ ආරක්ෂිතයින් ගේ මූලික තක්සේරුව පිළිබඳ විශේෂ නීති
දරුවෙක් ප්‍රාන්තයේ ආරක්ෂිතයෙක් නම් සහ ඔහුගේ/ඇයගේ දෙමව්පියන් සමග වාසය නොකරන්නේ නම් —

පහත සඳහන් අවස්ථා වලදී දරුවා ආබාධිත දරුවෙක්ද යන්න නිර්ණය සඳහා මූලික තක්සේරුවක් කිරීමට පාසල් දිස්ත්‍රික්කයට දෙමව්පියන්ගේ නිසි අවසරය අවශ්‍ය වන්නේ නැත:

1. සාධාරණ වෑයමකින් පසුවත් දරුවාගේ දෙමව්පියන් සොයා ගැනීමට පාසල් දිස්ත්‍රික්කයට නොහැකි අවස්ථා වලදී¦
2. ප්‍රාන්ත නීති වලට අනුව දෙමව්පියන්ගේ හිමිකම් නිශේධනය කර ඇති විටෙකදී¦ හෝ
3. විනිසුරුවරයෙක් හෝ දරුවාගේ සාමාන්‍ය සුභසිද්ධිය උදෙසා වගකීම් දරන පොදු ඒජන්සියක් විසින් දෙමව්පියන්ට හැර වෙනත් අයෙකුට දරුවා වෙනුවෙන් අධ්‍යාපනික තීරණ ගැනීමට සහ මූලික තක්සේරුවකට නිසි අවසරය ලබා දීමට අදාළ හිමිකම් පවරා ඇති විටෙකදී..

*IDEA* හි සඳහන් පරිදි *ප්‍රාන්තයේ ආරක්ෂිත* දරුවෙක් යනු:

1. දරුවාගේ හදා වඩා ගත් දෙමව්පියන්ට විනිසුරුවරයෙක් හෝ දරුවාගේ සාමාන්‍ය සුභසිද්ධිය උදෙසා වගකීම් දරන පොදු ඒජන්සියක් විසින් දරුවාගේ අධ්‍යාපනික තීරණ ගැනීමේ හිමිකම පවරා ඇති විටෙක හැර, හදා වඩා ගත් දරුවෙක්¦
2. ප්‍රාන්ත නීති අනුව ප්‍රාන්තයේ ආරක්ෂිතයෙක් ලෙස සැලකෙන දරුවෙක්¦
3. ප්‍රාන්ත නීති අනුව උසාවියේ ආරක්ෂිතයෙක් ලෙස සැලකෙන දරුවෙක්¦ හෝ
4. පොදු ළමා සුභසාධක ඒජන්සියක රැකවරණය යටතේ සිටින දරුවෙක්.

සේවා සඳහා අදාළ දෙමව්පියන්ගේ නිසි අවසරය
ඔබගේ දරුවාට ප්‍රථම වතාවට විශේෂ අධ්‍යාපනය ලබාදීමට හෝ ඒ හා අදාළ සේවා ලබා දීමට පෙර පාසල් දිස්ත්‍රික්කය විසින් ඔබව දැනුවත් කර නිසි අවසරය ලබා ගත යුතු අතර, එසේ දැනුවත් කර නිසි අවසරය ලබා ගැනීමට සාධාරණ වෑයමක් දැරිය යුතුය.

ප්‍රථම වතාවට ඔබගේ දරුවාට විශේෂ අධ්‍යාපනය ලබා දීමට සහ ඒ හා අදාළ අනෙකුත් සේවාවන් ලබා දීමට ඔබගේ නිසි අවසරය ඉල්ලීමකදී ඔබ ප්‍රතිචාර නොදක්වයි නම්, හෝ එවැනි නිසි අවසරයක් ලබා දීමට ඔබ ප්‍රතික්ෂේප කරයි නම්, ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් එකඟතාවය ලබා ගැනීමට හෝ ඔබගේ නිසි අවසරයකින් තොරව ඔබගේ දරුවාට විශේෂ අධ්‍යාපනය ලබා දීමට හෝ ඒ හා අදාළ සේවා (ඔබගේ දරුවාගේ *IEP* කණ්ඩායම විසින් නිර්දේශ කරනු ලබන) ලබා දීමට විනිශ්චයක් ලබා ගැනීමට, පටිපාටිගත සුරක්ෂිතතා (අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිලි, විසඳුම් සඳහා වන හමුවීම්, අපක්ෂපාතී අදාළ ක්‍රියාවලි සඳහා වන විභාග කිරීම් ආදිය) පාවිච්චි නොකරනු ඇත.

ප්‍රථම වතාවට ඔබගේ දරුවාට විශේෂ අධ්‍යාපනය ලබා දීමට සහ ඒ හා අදාළ අනෙකුත් සේවාවන් ලබා දීමට ඔබගේ නිසි අවසරය ඉල්ලීමකදී ඔබ ප්‍රතික්ෂේප කරයි නම් හෝ, ඔබ ප්‍රතිචාර නොදක්වයි නම් සහ ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් ලබා දීමට අවසර පැතූ එම විශේෂ අධ්‍යාපනය සහ සේවා දරුවා වෙත ලබා නොදෙයි නම්, ඔබගේ පාසල් දිස්ත්‍රික්කය:

1. එම සේවා දරුවාට ලබා දීමට අපොහොසත් වීම නිසාවෙන් ඔබගේ දරුවා වෙත *FAPE* ලබා දීමට ඇති අවශ්‍යතාව උල්ලංඝනය නොකරයි¦ සහ
2. ඔබගේ නිසි අවසරය අවශ්‍ය වූ ඔබගේ දරුවාට විශේෂ අධ්‍යාපනය ලබා දීමට සහ ඒ හා අදාළ සේවා ලබා දීමට *IEP* හමුවක් හෝ දරුවා වෙනුවෙන් *IEP* ආදී දියුණු කිරීමට අවශ්‍ය නොවේ.

දෙමව්පියන්ගේ නිසි අවසරය අවලංගු කිරීම
ඔබ විසින් ඔබගේ දරුවා වෙත විශේෂ අධ්‍යාපනය ඒ හා අදාළ සේවා ලබා දීමට අවශ්‍ය නිසි අවසරය අවලංගු කරන (බල රහිත කරන) බවට පාසල් දිස්ත්‍රික්කයට ලිඛිතව දැනුම් දෙන විටෙක දී, ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින්:

1. ඔබගේ දරුවාට විශේෂ අධ්‍යාපනය සහ ඒ හා අදාළ අනෙකුත් සේවා සැපයීම නවත්වනු ඇත¦
2. §300.503 දරණ *IDEA* රෙගුලාසි වලට ගැලපෙන ලෙස, ඔබගේ ලිඛිත නිසි අවසරය අවලංගු කිරීම මත පදනම්ව, විශේෂ අධ්‍යාපනය සහ ඒ හා අදාළ සේවා ලබා දීම නැවත්වීම පිළිබඳ සිය යෝජනාවලිය ඔබ වෙත ලිඛිත පෙර දැනුම්දීමකින් සිදු කළ යුතුය¦
3. ඔබගේ දරුවාට තව දුරටත් සේවා සැපයීමට එකඟතාවය ක් හෝ විනිශ්චයක් ලබා ගැනීමට අදාළ ක්‍රියාවලි (විසඳුම් සඳහා වන හමුවීම්, අපක්ෂපාතී අදාළ ක්‍රියාවලි සඳහා වන විභාග කිරීම්) ආදිය සිදු නොකරනු ඇත¦
4. තව දුරටත් විශේෂ අධ්‍යාපනය සහ ඒ හා අදාළ සේවා දරුවාට ලබා දීමට අපොහොසත් වීම නිසාවෙන් ඔබගේ දරුවා වෙත *FAPE* ලබා දීමට ඇති අවශ්‍යතාව උල්ලංඝනය නොකරයි¦
5. ඔබගේ දරුවාට තව දුරටත් විශේෂ අධ්‍යාපන ප්‍රතිපාදන ලබා දීමට සහ ඒ හා අදාළ සේවා ලබා දීමට *IEP* හමුවක් හෝ දරුවා වෙනුවෙන් *IEP* ආදී දියුණු කිරීමට අවශ්‍ය නොවේ¦ සහ

6. නිසි අවසරය අවලංගු කිරීම නිසා ඔබගේ දරුවා විශේෂ අධ්‍යාපනය සහ ඒ හා අදාළ සේවා ලද බවට ඇති යොමු කිරීම් ඔබේ දරුවාගේ අධ්‍යාපන සටහන් වලින් ඉවත් කිරීමට ඇමුණුම් සිදු කිරීම අවශ්‍ය නොවේ.

නැවත තක්සේරු කිරීම් හා අදාළ දෙමව්පියන්ගේ නිසි අවසරය
පහත සඳහන් දෑ ආදර්ශනය කළ නොහැකි අවස්ථාවන් හි දී, පාසල් දිස්ත්‍රික්කය විසින් ඔබගේ දරුවා නැවත තක්සේරු කිරීමට පෙර ඔබව දැනුවත් කර ඔබගෙන් නිසි අවසරය ලබා ගැනීම සිදු කළ යුතු වේ:

1. පාසල් දිස්ත්‍රික්කය විසින් දරුවාගේ නැවත තක්සේරුවට ඔබගේ නිසි අවසරය ලබා ගැනීමට සාධාරණ ක්‍රියාපටිපාටියක් අනුගමනය කළ බව¦ සහ
2. ඔබ ප්‍රතිචාරයක් නොදැක්වූ බව.

ඔබගේ දරුවාගේ නැවත තක්සේරුවට ඔබගේ නිසි අවසර ලබා නොදුනහොත්, පාසල් දිස්ත්‍රික්කය විසින් ඔබගේ නිසි අවසරය ලබා දීම ප්‍රතික්ෂේප කිරීම අභිබවා කටයුතු කර නැවත තක්සේරු කිරීමක් ලබා ගැනීමට අදාලව, අත්‍යාවශ්‍ය නොවන නමුත්, අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිලි කිරීම්, විසඳුම් සඳහා වන හමුවීම්, අපක්ෂපාතී අදාළ ක්‍රියාවලි සඳහා වන විභාග කිරීම් ආදී දෑ අනුගමනය කරනු ඇත. මූලික තක්සේරු කිරීම් වල පරිදි ම, මෙලෙස නැවත තක්සේරු කිරීමට ලබා ගැනීමට ප්‍රතික්ෂේප කිරීම මගින් ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් *IDEA* හි බී කොටස යටතේ ඇති සිය බැඳීම් උල්ලංඝනය කරනු නොලබයි.

දෙමව්පියන්ගේ නිසි අවසරය ලබා ගැනීමට අදාළ සාධාරණ වෑයම ලේඛනගත කිරීම
ඔබගේ පාසල විසින් මූලික තක්සේරු කිරීම් හා අදාළ දෙමව්පියන්ගේ නිසි අවසරය ලබා ගැනීම, ප්‍රථම වතාවට විශේෂ අධ්‍යාපනය සහ ඒ හා අදාළ සේවා ලබා දීම, නැවත තක්සේරු කිරීම සහ මූලික තක්සේරු කිරීම් සඳහා ප්‍රාන්තයේ ආරක්ෂිතයින් ගේ දෙමව්පියන් සොයා ගැනීම ආදී දෑ හා අදාළ සාධාරණ වෑයම ලේඛනගත කර පවත්වා ගත යුතුවේ. පහත සඳහන් අංශයන් හා අදාලව පාසල් දිස්ත්‍රික්ක විසින් සිදු කරනු ලැබූ උත්සාහයන් පිළිබඳව සටහන් මෙම ලේඛනයන්හි අන්තර්ගත විය යුතුය:

1. ලබා ගත් සහ නිරත වූ දුරකථන ඇමතුම් වල විස්තරාත්මක සටහන් සහ ඒවායේ ප්‍රතිඵලයන්¦
2. දෙමව්පියන් සමග හුවමාරු වූ ලිපිලේඛන සහ ඒවාට ලැබුණු ප්‍රතිචාර¦ සහ
3. දෙමව්පියන්ගේ නිවෙස් වලට හෝ ව්‍යාපාරික ස්ථාන වලට සිදු කළ යාම් ඊම් වල සවිස්තරාත්මක සටහන් සහ එම ගමන් වල ප්‍රතිඵලයන්.

නිසි අවසරය හා අදාළ අනෙකුත් අවශ්‍යතා
පහත අවස්ථාවන්ට පෙර ඔබගේ නිසි අවසරය අවශ්‍ය නොවේ:

1. ඔබගේ දරුවාගේ තක්සේරු කිරීම හෝ නැවත තක්සේරු කිරීමේ කොටසක් ලෙස දැනට පවතින තොරතුරු විශ්ලේෂණය කිරීම පාසල් දිස්ත්‍රික්කය විසින් සිදු කරන විට¦ හෝ
2. සියළුම දරුවන්ගේ දෙමව්පියන්ගේ නිසි අවසරය අවශ්‍ය වන විටෙක දී හැර, පාසල් දිස්ත්‍රික්කය විසින් අනෙකුත් සියළුම දරුවන්ට ලබා දෙන මූලික තක්සේරු ආකාරයක දී.

එක් කරුණක් වෙනුවෙන් ඔබගේ නිසි අවසරය ලබා නොදෙන විටෙක දී, ඔබට හෝ ඔබේ දරුවාට වෙනත් සේවයක්, ලාභයක් හෝ ක්‍රියාවක් ලබා නොදීම සඳහා ද එම නිසි අවසරය ලබා නොදීම භාවිතා කිරීමක් පාසල් දිස්ත්‍රික්කය විසින් සිදු නොවනු ඇත.

ඔබ විසින් ඔබගේ දරුවා ඔබගේ වියදමින් පෞද්ගලික පාසලකට ඇතුලත් කර ඇති විටෙකදී හෝ ඔබගේ දරුවා නිවසේ තබාගෙන උගන්වන විටෙක දී, සහ ඔබ ඔබගේ දරුවාගේ මූලික හෝ නැවත තක්සේරුවකට ඔබ විසින් නිසි අවසරය ලබා නොදෙන විටෙකදී, හෝ එසේ තක්සේරුවක් කිරීමට සිදු කරන ඉල්ලීමකට ඔබ විසින් ප්‍රතිචාර නොදක්වන විටෙක දී, පාසල් දිස්ත්‍රික්කය විසින් නිසි අවසරය අභිබවා යාමේ ක්‍රියාමාර්ග (අදාළ ක්‍රියාවලි

සඳහා වන පැමිණිලි කිරීම්, විසඳුම් සඳහා වන හමුවීම්, අපක්ෂපාතී අදාළ ක්‍රියාවලි සඳහා වන විභාග කිරීම් ආදී) අනුගමනය නොකරනු ඇති අතර, ඔබගේ දරුවා අපක්ෂපාතී සේවා ලැබීම සඳහා සුදුසුකම් ලබන්නෙකු ලෙස සැලකීම අවශ්‍ය නොවේ (දෙමව්පියන් විසින් පෞද්ගලික පාසල් වලට යවනු ලබන ආබාධිත දරුවන්ට ලැබෙන සේවා).

## ස්වාධීන අධ්‍යාපනික තක්සේරු

### 34 *CFR* §300.502

සාමාන්‍ය
පාසල් දිස්ත්‍රික්කය විසින් ඔබගේ දරුවා පිළිබඳව ලබා ගත් තක්සේරුව සමග ඔබ එකඟ නොවන්නේ නම්, පහත සඳහන් ආකාරයට ඔබගේ දරුවාගේ ස්වාධීන අධ්‍යාපනික තක්සේරුවක් [*Independent Educational Evaluation (IEE)*] ලබා ගැනීමට ඔබට හිමිකම ඇත.

ඔබ *IEE* සඳහා අයදුම් කළහොත්, *IEE* ලබා ගත යුතු ස්ථානය සහ *IEE* සඳහා අදාළ වන පාසල් දිස්ත්‍රික්කයේ නිර්ණායක පිළිබඳව පාසල් දිස්ත්‍රික්කය විසින් ඔබ හට තොරතුරු ලබා දිය යුතු වේ.

අර්ථ දැක්වීම්
*IEE* යනු ඔබගේ දරුවාගේ අධ්‍යාපනය පිළිබඳව වගකීම දරන පාසල් දිස්ත්‍රික්කය වෙනුවෙන් රැකියාව සිදු නොකරන, සුදුසුකම් ලත් පරීක්ෂකයෙකු විසින් සිදු කරනු ලබන තක්සේරුවකි.

පොදු වියදම යනු, එහි අවශ්‍යතා සපුරාලීමට කුමන හෝ ප්‍රාන්ත, ප්‍රාදේශීය, ෆෙඩරල් සහ පෞද්ගලික සම්පත් භාවිතා කිරීමට ප්‍රාන්තය වෙත ඉඩ ප්‍රස්ථා සලසන *IDEA* හි බී කොටසේ ප්‍රතිපාදන වලට ගැලපෙන ලෙස, පාසල් දිස්ත්‍රික්කය විසින් තක්සේරුවේ සම්පූර්ණ මුදල ගෙවීම හෝ තක්සේරුව ඔබට වියදමකින් තොරව යම් ආකාරයකට ලබා දීමයි.

මහජන වියදමින් තක්සේරුව කිරීමට දෙමව්පියන්ට ඇති හිමිකම
පහත සඳහන් කොන්දේසි වලට යටත්ව, පාසල් දිස්ත්‍රික්කය විසින් සිදු කරන ලද තක්සේරුවක් සමග ඔබ එකඟ නොවන්නේ නම්, ඔබගේ දරුවාට මහජන වියදමින් *IEE* සිදු කිරීමට ඔබට හිමිකම ඇත:

1. ඔබ විසින් මහජන වියදමින් ඔබගේ දරුවා පිළිබඳව *IEE* කිරීමට ලිඛිත ඉල්ලීමක් සිදු කළ විට, ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් එම ඉල්ලීම ලැබී දින හතක් තුළ ඔබගේ ඉල්ලීමට ප්‍රතිචාර දැක්විය යුතු අතර, එම ප්‍රතිචාරය මගින්: (ඒ) මහජන වියදමින් *IEE* ලබා දීම¦ හෝ (බී) ඔබගේ දරුවා පිළිබඳ සිය තක්සේරුව නිවැරදි බව විභාග කිරීමට අදාළ ක්‍රියාවලිය සඳහා වන පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම යනාදී ලෙස සිය ක්‍රියාමාර්ග පිළිබඳව පාසල් දිස්ත්‍රික්කයට දැන්විය යුතුය.
2. ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විභාග කිරීමකට ඉල්ලීමක් කර, එහි අවසන් තීරණය ඔබේ දරුවා පිළිබඳ පාසල් දිස්ත්‍රික්කයේ තක්සේරුව නිවැරදි යන්න වුවත් ඔබට මහජන වියදමින් නොව වෙනයම් අයුරකට *IEE* සඳහා හිමිකම ඇත.
3. ඔබ ඔබගේ දරුවා වෙනුවෙන් *IEE* ඉල්ලීමක් කළහොත්, පාසල් දිස්ත්‍රික්කය විසින් සිදු කළ තක්සේරුව කෙරෙහි ඔබ එකඟ නොවන්නේ මන්දැයි පාසල් දිස්ත්‍රික්කය විසින් ඔබගෙන් අසනු ඇත. එනමුත්, පාසල් දිස්ත්‍රික්කය විසින් ඔබගෙන් පැහැදිලි කිරීමක් ඉල්ලුම් නොකිරීමට ද ඉඩ ඇති අතර, අසාධාරණ ලෙස ඔබගේ දරුවාට මහජන වියදමින් *IEE* ලබා දීම හෝ, ඔබගේ දරුවා පිළිබඳ සිය තක්සේරුව නිවැරදි බව විභාග කිරීමට අදාළ ක්‍රියාවලිය සඳහා වන පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම සිදු නොකරනු ඇත.
4. ඔබ ලබා ගන්නා *IEE* පාසල් දිස්ත්‍රික්කයේ නිර්ණායක සමග නොගැලපෙන විටෙකදී, පාසල් දිස්ත්‍රික්කය විසින් අදාළ ක්‍රියාවලිය සඳහා වන පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සිදු කෙරෙනු ඇත. අදාළ

විභාගයේ අවසන් තීරණය එම තක්සේරුව පාසල් දිස්ත්‍රික්කයේ නිර්ණායක වලට අනුකූල නොවන බව වුවහොත්, ඔබගේ *IEE* හි වියදම මහජන වියදමින් දැරීම සිදු නොවනු ඇත.

පාසල් දිස්ත්‍රික්කය විසින් සිදු කරනු ලබන එක් තක්සේරුවක් සඳහා ඔබ එකඟ නොවන විටෙකදී, මහජන වියදමින් ඔබගේ දරුවා සඳහා *IEE* සිදු කර ගැනීම සඳහා ඔබට හිමිකම ඇත්තේ එක් වරක් පමණි.

දෙමව්පියන් විසින් සිදු කරනු ලබන තක්සේරු
ඔබ මහජන වියදමින් ඔබගේ දරුවාගේ *IEE* ලබා ගන්නේ නම් හෝ ඔබගේ පෞද්ගලික වියදමෙන් සිදු කළ ඔබගේ දරුවාගේ තක්සේරුවක් ඔබ විසින් පාසල් දිස්ත්‍රික්කයට ලබා දෙන අවස්ථාවක දී:

1. *IEE* සඳහා වන පාසල් දිස්ත්‍රික්කයේ නිර්ණායක සමග සැසඳෙන්නේ නම් ඔබගේ දරුවා හට *FAPE* ප්‍රතිපාදනය සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට අදාලව, ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් එම තක්සේරුවේ ප්‍රතිඵල සලකා බැලිය යුතු වේ; සහ
2. ඔබගේ දරුවා පිළිබඳව වන අදාළ ක්‍රියාවලි සඳහා වන විභාග කිරීමකදී ඔබ හෝ ඔබගේ පාසල් දිස්ත්‍රික්කය විසින් එම තක්සේරුව සාක්ෂි ලෙස ඉදිරිපත් කළ යුතු වේ.

පරිපාලන නීති විනිසුරුවරයෙකු විසින් සිදු කරනු ලබන තක්සේරු සඳහා වන ඉල්ලීම්
පරිපාලන නීති විනිසුරුවරයෙකු [*Administrative Law Judge* (*ALJ*)] විසින් අදාළ ක්‍රියාවලි සඳහා වන විභාග කිරීමකදී ඔබගේ දරුවා පිළිබඳව *IEE* සඳහා ඉල්ලීමක් සිදු කළහොත්, එම තක්සේරුව මහජන වියදමින් සිදු කළ යුතු වේ.

පාසල් දිස්ත්‍රික්ක නිර්ණායක
*IEE* මහජන වියදමින් සිදු කෙරේ නම්, තක්සේරුව සිදු කරන ස්ථානය සහ පරීක්ෂකවරයාගේ සුදුසුකම් ආදියද ඇතුළුව, තක්සේරුව ලබා ගන්නා නිර්ණායක, පාසල් දිස්ත්‍රික්කය විසින් සිය තක්සේරුවක් සිදු කිරීමේදී භාවිතා කරනු ලබන නිර්ණායක සමග සම විය යුතුවේ (*IEE* සඳහා ඔබගේ හිමිකම සමග එම නිර්ණායක ගැලපෙන ලෙස).

ඉහත විස්තර කරන ලද නිර්ණායක වලට අමතරව, මහජන වියදමින් *IEE* ලබා ගැනීම පිළිබඳව පාසල් දිස්ත්‍රික්කය විසින් කොන්දේසි හෝ වේලාවන් පැනවීම සිදු නොකළ යුතුවේ.

## තොරතුරු වල රහස්‍යභාවය

### අර්ථ දැක්වීම්

**34 *CFR* §300.611**
මාතෘකාව යටතේ භාවිතා කර ඇති පරිදි, **තොරතුරු වල රහස්‍යභාවය**:

- *විනාශය* යනු තොරතුරු පෞද්ගලිකව හඳුනාගත නොහැකි වන අයුරින් භෞතිකව විනාශ කිරීම හෝ පෞද්ගලික හඳුනාගැනීම ඉවත් කිරීමයි.
- *අධ්‍යාපනික වාර්තා* යනු 34 *CFR* 99 වන කොටසෙහි (1974 පවුල් අධ්‍යාපන හිමිකම් සහ පුද්ගලිකත්ව පනත [*Family Educational Rights and Privacy Act (FERPA)*], 20 එක්සත් ජනපද කේත අංක [*United States Code (U.S.C.)*] 1232g ක්‍රියාත්මක කිරීමේ රෙගුලාසි) —අධ්‍යාපනික වාර්තා˜ යන අර්ථ දැක්වීම යටතේ ආවරණය වන වාර්තා වේ. *FERPA* විසින්, ˜අධ්‍යාපනික වාර්තා˜ යන්න ශිෂ්‍යයෙකුට සෘජුවම සම්බන්ධ වන සහ අධ්‍යාපනික ආයතනයක් විසින් හෝ එම ආයතනය සඳහා ක්‍ර˜යා කරන පාර්ශවයක් විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා ලෙස අර්ථ දක්වයි.
- *සහභාගී වන ආයතනය* යනු *IDEA* හි බී කොටස යටතේ තොරතුරු ලබාගන්නා හෝ පෞද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු එකතු කරන, පවත්වා ගෙන යන හෝ භාවිතා කරන කවර හෝ පාසැල් දිස්ත්‍රික්කයක් හෝ ආයතනයක් වේ.

### පෞද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු

**34 *CFR* §300.32**
*පෞද්ගලිකව හඳුනාගත හැකි* යනු පහත සඳහන් දෑ අඩංගු තොරතුරු වේ:

a. ඔබගේ දරුවාගේ නම, දෙමාපියෙක් වන ඔබේ නම, හෝ වෙනත් පවුලේ කෙනෙකුගේ නම¦
b. ඔබගේ දරුවාගේ ලිපිනය¦
c. ඔබගේ දරුවාගේ සමාජ ආරක්ෂක අංකය හෝ ශිෂ්‍ය අංකය වැනි පෞද්ගලිකව හඳුනාගත හැකි යමක්¦ හෝ
d. ආසන්න වශයෙන් ඔබේ දරුවා යැයි නිශ්චිතව හඳුනා ගැනීමට හැකි වන පෞද්ගලික ලක්ෂණ හෝ වෙනත් තොරතුරු ලැයිස්තුවක්.

### දෙමව්පියන් වෙත කෙරෙන දැන්වීම

**34 *CFR* §300.612**
පෞද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු වල රහස්‍යභාවය පිළිබඳ මවුපියන් දැනුවත් කිරීමට පහත දැක්වෙන පරිදි ප්‍රමාණවත් ක්‍රියා පටිපාටි සහ ප්‍රතිපත්ති තමන් සතු බව මිචිගන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව *MDE* විසින් දෙමව්පියන්ට දැනුම් දිය යුතුය:

1. නිවේදනය කෙතරම් දුරකට රාජ්‍යයේ විවිධ ජනකොටස් වල මව්බසෙන් නිකුත් කෙරේද යන්න පිළිබඳ විස්තරයක්¦
2. පෞද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු පවත්වාගෙන යන දරුවන්, සොයන තොරතුරු ආකාර, තොරතුරු රැස් කිරීම සඳහා රජය භාවිත කිරීමට සැරසෙන ක්‍රම (තොරතුරු රැස් කිරීමට ගන්නා ප්‍රභවයන් ද ඇතුලත්ව) සහ තොරතුරු වලින් ඇති ප්‍රයෝජන ගැන විස්තරයක්¦
3. ගබඩා කර ගැනීම, තෙවන පාර්ශව වෙත අනාවරණය කිරීම, පුද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු රඳවා තබා ගැනීම හා විනාශ කිරීම පිළිබඳව සහභාගී වන ඒජන්සි විසින් අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටීන් වල සාරාංශයක්.

4. *FERPA* යටතේ අයිතිවාසිකම් සහ *CFR* 34 හි 99 වන කොටසෙහි ක්‍රියාත්මක කිරීමේ රෙගුලාසි අයිතිවාසිකම් ඇතුලත් මෙම තොරතුරු සම්බන්ධයෙන් දෙමව්පියන් සහ දරුවන්ගේ සියලු අයිතිවාසිකම් පිළිබඳ විස්තරයක්.

කිසිඳු ප්‍රධාන හඳුනා ගැනීමක්, පිහිටීමක් හෝ ඇගයුම් ක්‍රියාවලියකට පෙර ("දරුවා සොයා ගැනීම" යනුවෙන් ද හැඳින්වේ) අදාළ දැන්වීම පුවත්පත් හෝ වෙනත් මාධ්‍යවල හෝ දෙආකාරයෙන්ම හෝ ප්‍රමාණවත්ව ප්‍රකාශයට පත් කර, විශේෂ අධ්‍යාපනය හා අදාළ සේවාවන්හි අවශ්‍යතාව ඇති ළමුන් සොයාගැනීමට, හඳුනා ගැනීමට සහ ඇගයීමට ක්‍රියාකාරී ප්‍රදේශවල දෙමාපියන් දැනුවත් කළ යුතු වේ.

## ප්‍රවේශ අයිතීන්

**34 *CFR* §300.613**
සහභාගී වන ආයතනය ඔබට ඔබේ දරුවා පිලිබඳ එකතු කරන ලද, පවත්වාගෙන යන හෝ *IDEA* හි බී කොටස යටතේ සහභාගීත්ව ආයතනය විසින් භාවිතා කරනු ලබන අධ්‍යාපන වාර්තා පරීක්ෂා කිරීමට සහ සමාලෝචනය කිරීමට අවසර දිය යුතුය යම් අවස්ථාවක ඔබ ඉල්ලීමක් කළ දින සිට දින 45 කට වඩා වැඩි කාලයක් නොගොස්, ඔබගේ ඉල්ලීමට අනුව අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඔබේ දරුවාගේ අධ්‍යාපන වාර්තාව පරීක්ෂා කිරීමට හා සමාලෝචනය කිරීම සඳහා සහ *IEP* සම්බන්ධයෙන් යම් රැස්වීමකට පෙර හෝ යම් අපක්ෂපාත නිසි ක්‍රියාපටිපාටියක් විභාග කිරීමේදී (විසඳුම් සඳහා වන හමුවීම හෝ හික්මීම පිළිබඳ විභාගය ඇතුළුව) සහභාගී වන ආයතනය අනුකූල විය යුතුය

අධ්‍යාපන වාර්තා පරීක්ෂා කිරීමේ සහ සමාලෝචනය කිරීමේ අයිතිය යටතේ පහත දෑ ඔබ සතු වේ:

1. වාර්තා පිලිබඳ ඔබගේ සාධාරණ ඉල්ලීම් වලට අදාළ කරුණු සහ ඒවායේ අර්ථ නිරූපණය සඳහා ප්‍රතිචාරයක් සහභාගී වන ආයතනයෙන් ලබා ගැනීමේ අයිතිය ඔබ සතුය.
2. වාර්තා වල පිටපත් නොලැබ ඔබට ඒවා කාර්යක්ෂමව පරීක්ෂා කර බැලීමට සහ සමාලෝචනය කළ නොහැකි නම් සහභාගී වන ආයතනයෙන් පිටපතක් ලබාදෙන මෙන් ඉල්ලීමේ අයිතිය ඔබ සතුය.
3. ඔබගේ නියෝජිතයා මගින් වාර්තා පරීක්ෂා කිරීමේ සහ සමාලෝචනය කිරීමේ අයිතිය ඔබ සතුය.

භාරකාරත්වය, වෙන්වීම හා දික්කසාද වැනි කටයුතුවලට අදාල ප්‍රාන්ත නීති යටතේ ඔබට අධිකාරය නොලැබේනම් මිස ඔබේ දරුවාට අදාළ වාර්තා පරීක්ෂා කිරීම සහ සමාලෝචනය කිරීමට ඔබට බලය ඇති බවට සහභාගී වන ආයතනයෙන් පිළිගනු ඇත.

## ප්‍රවේශය පිලිබඳ වාර්තාව

**34 *CFR* §300.614**
සෑම සහභාගී වන ආයතනයක්ම, *IDEA* හි බී කොටස යටතේ එකතු කරනු ලැබූ, නඩත්තු කරන හෝ භාවිතා කරන අධ්‍යාපන වාර්තා වලට පිවිසිය හැකි පාර්ශවයන්ගේ වාර්තාවක් (දෙමව්පියන් සහ නියෝජිතායතනයේ බලයලත් සේවකයන් හැරෙන්නට) එම පාර්ශවයේ නම, ප්‍රවේශය ලබා දී ඇති දිනය, එම වාර්තා භාවිතා කිරීමට පාර්ශවයට බලය ඇති කාර්යයද ඇතුලත්ව තබා ගත යුතුය.

## එක් දරුවෙකුට වඩා වැඩි ගණනක් පිලිබඳ වාර්තා

**34 *CFR* §300.615**
යම් අධ්‍යාපන වාර්තාවක එක් දරුවෙකුට වඩා වැඩි ගණනකගේ තොරතුරු ඇතුළත් වේ නම්, එම දරුවන්ගේ දෙමාපියන්ට තම දරුවාට අදාළ තොරතුරු පමණක් පරීක්ෂා කර බැලීමට හෝ එම තොරතුරු ගැන දැනගනීමට අයිතියක් ඇත.

### තොරතුරු වර්ග හා පිහිටි ස්ථාන පිළිබඳ ලැයිස්තුව

**34 *CFR* §300.616**
ඉල්ලීම් අනුව, සෑම සහභාගී වන ආයතනයක්ම එකතු කරන ලද, නඩත්තු කරන හෝ ආයතනය විසින් භාවිතා කරන අධ්‍යාපන වාර්තා වල වර්ග සහ ස්ථාන ලැයිස්තුවක් ඔබට සැපයිය යුතුය.

### ගාස්තු

**34 *CFR* §300.617**
ගාස්තුවක් මඟින් ඔබ එම වාර්තා පරීක්ෂා කිරීමට සහ සමාලෝචනය කිරීමට ඔබට ඇති අයිතිය යොදා ගැනීම ඵලදායී ලෙස නොවළක්වයි නම්, *IDEA* හි බී කොටස යටතේ ඔබ වෙනුවෙන් සාදන ලද වාර්තා පිටපත් සඳහා සහභාගී වන ආයතනයන් විසින් ගාස්තුවක් අය කළ හැකිය.

*IDEA* හි බී කොටසෙහි තොරතුරු සොයා ගැනීමට හෝ ලබා ගැනීමට සහභාගී වන ආයතනය ගාස්තුවක් අය නොකරනු ලැබේ.

### දෙමාපියන්ගේ ඉල්ලීම මත වාර්තා සංශෝධනය කිරීම

**34 *CFR* §300.618**
*IDEA* හි බී කොටසෙහි එකතු කරන ලද, පවත්වාගෙන ගිය හෝ පාවිච්චි කරන ලද ඔබේ දරුවා පිළිබඳ අධ්‍යාපන වාර්තා වල තොරතුරු වැරදි බව, නොමඟ යවන සුළු බව හෝ ඔබගේ දරුවාගේ පෞද්ගලිකත්වය හෝ වෙනත් අයිතිවාසිකම් උල්ලංඝනය වේයැයි ඔබ විශ්වාස කරන්නේ නම්, ඔබට එම තොරතුරු පවත්වාගෙන යන සහභාගී වන ආයතනයෙන් තොරතුරු වෙනස් කරන මෙන් ඉල්ලා සිටිය හැකිය.

ඔබගේ ඉල්ලීම ලැබීමෙන් සාධාරණ කාලසීමාවක් ඇතුළත ඔබගේ ඉල්ලීමට අනුව තොරතුරු වෙනස් කරනවාද නැද්ද යන්න සහභාගී වන ආයතනය තීරණය කළ යුතුය.

ඔබගේ ඉල්ලීම අනුව තොරතුරු වෙනස් කිරීමට සහභාගී වන ආයතනය ප්‍රතික්ෂේප කරයි නම්, එය ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඔබට දැනුම් දිය යුතු අතර, නඩු විභාගයකට අවස්ථාවක් යන මාතෘකාව යටතේ විස්තර කර ඇති පරිදි නඩු විභාගය සඳහා ඇති අයිතිය පිළිබඳව ඔබට උපදෙස් ලබා දිය යුතුය.

### නඩු විභාගයකට අවස්ථාවක්

**34 *CFR* §300.619**
ඔබේ දරුවාගේ පෞද්ගලිකත්වය හෝ වෙනත් අයිතිවාසිකම් උල්ලංඝනය නොවන බවට, නොමඟ නොයවන බවට හෝ නිවැරදි බවට සහතික කරගැනීමට සහභාගී වන ආයතනය විසින්, ඔබේ ඉල්ලීම පරිදි, ඔබගේ දරුවාගේ අධ්‍යාපන වාර්තා පිළිබඳ තොරතුරු අභියෝගයට ලක් කිරීමට නඩු විභාගයක් සඳහා ඔබට අවස්ථාවක් ලබා දිය යුතුය.

### විභාග කිරීම්

**34 *CFR* §300.621**
*FERPA* යටතේ එවැනි විභාග සඳහා පටිපාටිවලට අනුකූලව අධ්‍යාපන වාර්තා වල තොරතුරු අභියෝගයට ලක් කිරීමට විභාගයක් පැවැත්විය යුතුය.

## නඩු විභාගයේ ප්‍රතිඵල

**34 *CFR* §300.620**

මෙම නඩු විභාගයේ ප්‍රතිඵලයක් ලෙස සහභාගී වන ආයතනය විසින් තොරතුරු වැරදි බවක්, නොමඟ යැවීමක් හෝ දරුවාගේ පෞද්ගලික අයිතිවාසිකම් හෝ වෙනත් අයිතිවාසිකම් උල්ලංඝනය විමක් යැයි තීරණය කරනු ලැබුවහොත්, එම ආයතනය ඒ අනුව එම තොරතුරු වෙනස් කර ඔබට ලිඛිතව දැනුම් දිය යුතුය.

මෙම නඩු විභාගයේ ප්‍රතිඵලයක් ලෙස සහභාගී වන ආයතනය විසින් තොරතුරු වැරදි බවක්, නොමඟ යැවීමක් හෝ දරුවාගේ පෞද්ගලික අයිතිවාසිකම් හෝ වෙනත් අයිතිවාසිකම් උල්ලංඝනය විමක් යැයි තීරණය කරනු ලැබුවහොත්, එම ආයතනය ඔබට ඇති අයිතීන් වන ඔබේ දරුවා ගැන ඔවුන් රඳවා තබා ඇති වාර්තා ලබා ගැනීම, තොරතුරු ගැන අදහස් දක්වන ප්‍රකාශය ක් කිරීම හෝ නියෝජිතායතනයේ තීරණය සම්බන්ධයෙන් ඔබ එකඟ නොවන හේතු දැක්වීම පිලිබඳ දැනුවත් කල යුතුයි.

ඔබේ දරුවාගේ වාර්තාව පිලිබඳ කළ එවැනි පැහැදිලි කිරීමක්:

1. සහභාගී වන ආයතනය මගින් වාර්තාව හෝ තරඟ කරන ලද කොටස පවත්වා ගෙන යන තාක්කල් ඔබේ දරුවාගේ වාර්තාවන්හි ම කොටසක් ලෙස සහභාගී වන ආයතනය විසින් පවත්වාගෙන යා යුතු වේ; සහ
2. සහභාගී වන ආයතනය ඔබගේ දරුවාගේ වාර්තාව හෝ අභියෝගයට ලක් වූ කොටස කවර හෝ පාර්ශවයකට හෙළි කළ හොත්, පැහැදිලි කිරීමද එම පාර්ශවයට හෙළි කළ යුතු වේ.

## පෞද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු අනාවරණය කිරීම සඳහා නිසි අවසරය

**34 *CFR* §300.622**

*FERPA* විසින් අවසර දී නොමැති අධ්‍යාපනික වාර්තා හි අන්තර්ගත පෞද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු (දෙමව්පිය නිසි අවසරය නොමැතිව), සහභාගී වන ආයතන වල නියෝජිතයන්ගෙන් බාහිර අයෙකුට අනාවරණය කිරීමට පෙර ඔබේ නිසි අවසරය ගත යුතුය. පහත දැක්වෙන තත්වයන් යටතේ හැරෙන්නට, *IDEA* හි බී කොටසෙහි අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා සහභාගී වන ආයතනවල නිලධාරීන්ට, පෞද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු ලබා දීමට පෙර ඔබේ නිසි අවසරය අවශ්‍ය නොවේ.

පෞද්ගලිකව හඳුනාගතහැකි තොරතුරු සහභාගී වන ආයතනයක නිලධාරීන් වෙත ලබාදීමට ප්‍රථම හුවමාරු කිරීමේ සේවා සැපයීම හෝ ඒ සඳහා ගෙවීම් සිදුකර, ඔබේ නිසි අවසරය හෝ ප්‍රාන්ත නීතිය යටතේ නිසි වයසට පත් වී ඇති දරුවාගේ නිසි අවසරය ලබාගත යුතුය.

ඔබේ දරුවා ඔබ පදිංචි ප්‍රදේශයේ පාසැල් දිස්ත්‍රික්කයට පිටින් පිහිටි පෞද්ගලික පාසලකට ඇතුලත්ව සිටින්නේ නම්, හෝ ඉදිරියේදී ඇතුලත් වීමට සිටීනම්, ඔබේ දරුවා පිළිබඳ පුද්ගලිකව හඳුනාගත හැකි ඕනෑම තොරතුරක් පාසැල් දිස්ත්‍රික්කයේ නිලධාරීන් සහ ඔබ පදිංචි ප්‍රදේශයේ පාසැල් දිස්ත්‍රික්කයේ නිලධාරීන් අතර නිදහස් කිරීමට පෙර ඔබේ නිසි අවසරය ලබා ගත යුතුය.

## සුරක්ෂිතතාවන්

**34 *CFR* §300.623**

සෑම සහභාගී වන ආයතනයක්ම එකතු කිරීමේදී, ගබඩා කිරීමේදී, අනාවරණය කිරීමේදී සහ විනාශ කිරීමේ අදියරයන්හිදී පුද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා කළ යුතුය.

සෑම සහභාගී වන ආයතනයකින්ම එක් නිළධාරියෙකු විසින් පුද්ගලිකව හඳුනාගත හැකි තොරතුරුවල රහස්‍යභාවය සහතික කිරීම සඳහා වග බලා ගත යුතුය.

*IDEA* සහ *FERPA* හි බී කොටස යටතේ පෞද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු එක්රැස් කරන හෝ භාවිතා කරන සියලු පුද්ගලයින්ට පුහුණුවක් හෝ රහස්‍යභාවය පිළිබඳව මිචිගන්හි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ගැන උපදෙස් සැපයිය යුතුය.

මහජන පරීක්ෂණය සඳහා සෑම සහභාගී වන ආයතනයක්ම, පුද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු වලට ප්‍රවේශ විය හැකි සේවකයින්ගේ නම් හා තනතුරුවල වර්තමාන ලැයිස්තුවක් පවත්වාගෙන යා යුතුය.

### තොරතුරු වල විනාශය

**34 *CFR* §300.624**
*IDEA* හි බී කොටස යටතේ එකතු කරන ලද, නඩත්තු කරන ලද හෝ භාවිතා කරන ලද පෞද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු ඔබේ දරුවාට අධ්‍යාපන සේවාවන් සැපයීම සඳහා තවදුරටත් අවශ්‍ය නොවේ නම් ඔබගේ පාසල් දිස්ත්‍රික්කයෙන් එය ඔබට දැනුම් දිය යුතුය.

ඔබේ ඉල්ලීම අනුව තොරතුරු විනාශ කළ යුතුය. කෙසේ වෙතත්, ඔබේ දරුවාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය, ඔහුගේ හෝ ඇයගේ ශ්‍රේණි, පැමිණීමේ වාර්තාව, සහභාගී වූ විෂයයන්, ශ්‍රේණියේ මට්ටම් සහ සම්පූර්ණ කළ වර්ෂය පිළිබඳ ස්ථිර වාර්තාවක් කාලයේ සීමිත බවකින් තොරව පවත්වාගෙන යා හැකිය.

### ශිෂ්‍ය අයිතිවාසිකම්

**34 *CFR* §300.625**
*FERPA* සඳහා වූ රෙගුලාසි යටතේ, අධ්‍යාපන වාර්තා සම්බන්ධයෙන් දෙමාපියන්ගේ අයිතිවාසිකම් වයස අවුරුදු 18 දී ශිෂ්‍යයා ට පැවරේ.

*IDEA* හි බී කොටස යටතේ අධ්‍යාපන වාර්තා පිළිබඳ දෙමව්පියන්ගේ අයිතිවාසිකම්ද වයස අවුරුදු 18 දී ශිෂ්‍යයා ට පැවරේ. කෙසේ වෙතත් සහභාගී වන ආයතනය විසින්, *IDEA* හි බී කොටස යටතේ ඇති ඕනෑම නිවේදනයක් ශිෂ්‍යයා සහ දෙමාපියන් යන දෙපාර්ශවයටම දැනුම්දිය යුතුය.

## මැදිහත්වීම

### මැදිහත්වීම

**34 *CFR* §300.506**

සාමාන්‍ය
*MDE* විසින්, *IDEA* හි බී හෝ සී කොටස් යටතේ ඇති ඕනෑම කරුණක් සම්බන්ධව ඇති, රාජ්‍ය පැමිණිල්ලක් හෝ අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට පෙර ඇතිවූ ගැටළුද ඇතුළුව, විවිධ නොඑකඟතාවන් මැදිහත්වීම මගින් විසඳා ගැනීම සඳහා ඔබ සහ පාසල් දිස්ත්‍රික්කයට ඉඩ සලසා දී ඇත. මේ අනුව, *IDEA* හි කොටස් බී හෝ සී හි ආරවුල් විසඳීම සඳහා මැදිහත්වීමක් ලබා ගත හැකි අතර, අදාළ ක්‍රියාවලිය පිළිබඳ විභාග කිරීමක් ඉල්ලා සිටීමට ඔබ විසින් අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ඉදිරිපත් කලේද නැද්ද යන්න, **අදාළ ක්‍රියාවලිය පිළිබඳ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම** යන මාතෘකාව යටතේ විස්තර කර ඇත.

අවශ්‍යතා
අදාළ ක්‍රියාමාර්ග මගින් මැදිහත්වීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳව පහත දෑ සහතික කරනු ලබයි:

1. ඔබට සහ පාසල් දිස්ත්‍රික්කයට අදාලව ස්වේච්ඡාවෙන් සිදු වන බව;

2. අදාළ ක්‍රියාවලි පිළිබඳ විභාග කිරීමක් සඳහා වන ඔබේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කිරීමට හෝ ප්‍රමාද කිරීමට හෝ *IDEA* හි බී හෝ සී කොටස් යටතේ ඔබ සතු වෙනත් අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීමට භාවිතා නොකෙරෙන බව¦ සහ
3. එලදායී මැදිහත්වීමේ ක්‍රමවේදයන් සඳහා පුහුණු වූ, සුදුසුකම් ලත් හා අපක්ෂපාතී මැදිහත්කරුවකු විසින් මෙහෙයවනු ලැබෙන බව.

මැදිහත්වීමේ ක්‍රියාවලිය භාවිතා නොකිරීමට තෝරා ගන්නා දෙමව්පියන්ට සහ පාසල්වලට, පහත දැක්වෙන උනන්දු නොවූ පාර්ශවයක් සමග ඔබට පහසු වෙලාවක සහ ස්ථානයකදී හමුවීමට අවස්ථාවක් ලබාදෙන ක්‍රමවේදයන් පාසැල් දිස්ත්‍රික්කයෙන් සංවර්ධනය කළ හැකිය:

1. ඔවුන් සුදුසු විකල්ප ආරවුල් විසඳීමේ ආයතනයක්, හෝ දෙමව්පියන් පුහුණු කිරීමේ සහ තොරතුරු මධ්‍යස්ථානයක් හෝ රාජ්‍ය මාපිය සම්පත් මධ්‍යස්ථානයක් සමඟ ගිවිසුමකට යටත්ය¦ සහ
2. ඔබට ප්‍රතිලාභ පැහැදිලි කිරීම සහ මැදිහත්වීමේ ක්‍රියාවලිය භාවිතා කිරීමට දිරිගැන්වීම සිදු කරනු ඇත.

*MDE* ය සුදුසුකම් ඇති මැදිහත්කරුවන් සහ විශේෂ අධ්‍යාපන හා අදාළ සේවාවන් ප්‍රතිපාදනය සම්බන්ධ නීති සහ රෙගුලාසි ගැන දැනුවත් පුද්ගලයන්ගේ ලැයිස්තුවක් පවත්වාගෙන යා යුතුය. *MDE* විසින් අහඹු, භ්‍රමණ හෝ වෙනත් අපක්ෂපාතී පදනමක් මත මැදිහත්කරුවන් තෝරා ගත යුතුය.

රැස්වීම්වල වියදම් ද ඇතුලත්ව මැදිහත්වීමේ ක්‍රියාවලිය සඳහා යන වියදම් වලට රජය වගකිව යුතුය. මෙම සේවාවන් දෙනු ලබන්නේ විශේෂ අධ්‍යාපනික මැදිහත් වීමේ සේවා *[Special Education Mediation Services]* (*http://MiKids1st.org*).

මැදිහත්වීමේ ක්‍රියාවලියේ සෑම රැස්වීමක්ම කාලානුරූපීව සැලසුම් කර තිබිය යුතු අතර ඔබට හා පාසල් දිස්ත්‍රික්කයට පහසු ස්ථානයක පැවැත්විය යුතුය.

ඔබ සහ පාසල් දිස්ත්‍රික්කය මැදිහත්වීමේ ක්‍රියාවලිය හරහා ආරවුලක් විසඳා ගන්නේ නම්, පාර්ශවකරුවන් දෙදෙනාම විසින් විසඳුම ස්ථාපනය කරන සහ පහත දෑ සඳහන් කරන නීත්‍යානුකූලව බැඳී ඇති ගිවිසුමක් අත්සන් කළ යුතුය:

1. මැදිහත්වීමේ ක්‍රියාවලිය තුළ සිදු වූ සියලු සාකච්ඡා රහසිගතව තබනු ලබන අතර කිසිඳු පසුකාලීන හෝ සිවිල් ක්‍රියා පටිපාටියකදී සාක්ෂි ලෙස භාවිතා කළ නොහැකි බව.
2. පාසැල් දිස්ත්‍රික්කය බඳවා තබා ගැනීමට බලය ඇති පාසැල් දිස්ත්‍රික් නියෝජිතයෙකු සහ ඔබ අතර අත්සන් කරනු ලැබෙන බව.

ලිඛිත, අත්සන් කරන ලද මැදිහත්වීමේ ගිවිසුමක් ඕනෑම නිශ්චිත අධිකරණ බලයක් ඇති අධිකරණයක් (මේ ආකාරයේ නඩු විභාග කිරීම සඳහා ප්‍රාන්ත නීති යටතේ බලය ඇති අධිකරණයක්) තුළ හෝ එක්සත් ජනපදයේ දිස්ත්‍රික් උසාවියක් බලාත්මක විය හැකිය.

මැදිහත්වීමේ ක්‍රියාවලියේදී සිදු වූ සාකච්ඡාවන් රහසිගත විය යුතුය. ඒවා *IDEA* හි බී හෝ සී කොටස යටතේ කිසිඳු අනාගත විභාගයකදී, රාජ්‍ය අනුග්‍රහය ලැබෙන උසාවියක හෝ ඕනෑම ෆෙඩරල් උසාවියක වන සිවිල් ක්‍රියා පටිපාටියකදී සාක්ෂි ලෙස භාවිතා කළ නොහැකිය.

මැදිහත්කරුගේ අපක්ෂපාතීත්වය
මැදිහත්කරු:

1. ඔබේ දරුවාගේ අධ්‍යාපනය හෝ රැකවරණය සම්බන්ධව සිටින *MDE* හෝ පාසල් දිස්ත්‍රික්කයෙහි සේවකයෙකු නොවිය හැකිය¦ සහ

2. සිය ඉලක්කයන් සමග පටහැනි වන පෞද්ගලික හෝ වෘත්තීය උනන්දුවක් ඇති පුද්ගලයෙක් නොවිය යුතුය.

ඔහු හෝ ඇය විසින් මැදිහත්කරුවකු ලෙස සේවය කරන ආයතනය හෝ පාසල් දිස්ත්‍රික්කය විසින් ගෙවීම් කරනු ලබන නිසාම මැදිහත්කරුවෙක් ලෙස සුදුසුකම් ලබන පුද්ගලයෙක් පාසැල් දිස්ත්‍රික්කයක හෝ රජයේ ආයතනයක සේවකයෙකු නොවේ.

# ප්‍රාන්ත පැමිණිලි ක්‍රියාවලි

## අදාළ ක්‍රියාවලිය පිළිබඳව පැමිණිලි කිරීම හා විභාග කිරීමේ සහ ප්‍රාන්ත පැමිණිලි ක්‍රියාවලි අතර වෙනස්කම්

*IDEA* හි බී කොටසේ රජයේ පැමිණිලි කිරීම් සහ අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිලි කිරීම සහ පැමිණිලි විභාග කිරීම සම්බන්ධව වෙන් වෙන්ව සදහන් කර ඇත. පහත විස්තර කර ඇති පරිදි, බී කොටසේ හෝ සී කොටසේ සදහන් අවශ්‍යතාවයන් පාසල් දිස්ත්‍රික්කයක් විසින්, *MDE* විසින් හෝ වෙනත් පොදු ඒජන්සියක් විසින් උල්ලංඝනය කිරීමක් සම්බන්ධව යම් පුද්ගලයෙකු හෝ සමාගමක් විසින් රජයේ පැමිණිල්ලක් ගොනු කළ හැකිය. ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කයක් විසින් පමණක් යෝජනා අයදුම්පතෙහි ගැටළු සම්බන්ධව හෝ ස්ථාපනය කිරීම ප්‍රතික්ෂේප කිරීමක් හෝ හැඳුනුම්පත් වෙනස් කිරීම විමර්ශනය හෝ දරුවන්ගේ ආබාධිත තත්ත්වයට අදාළ ඉගෙනුම් පරිසරය වෙනස් කිරීම හෝ *FAPE* ප්‍රතිපාදනය සම්බන්ධව තිබෙන අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොනු කළ හැකිය. *MDE* හි කාර්යය මණ්ඩලය විසින් සාමාන්‍ය පරිදි රජයේ පැමිණිල්ලක් දින දර්ශනයට අනුව දින 60ක කාලසීමාවක් තුළ විසදුමක් ලබාදෙන අතරතුරේ දී කාලසීමාව ඉක්මවා ගියහොත් පමණක් (විසඳුම් සඳහා වන හමුවීම හෝ මැදිහත් වීමක් මගින් විසදුමක් ගැනීම සිදු කල නොහැකි නම්) අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් *ALJ* විසින් විභාග කළ යුතු අතර මෙම ලේඛනයේ **විසඳුම් ක්‍රියාවලිය** නම් මාතෘකාව තුල සඳහන් කළ පරිදි විසඳීමේ ක්‍රියාවලිය හෝ ඔබ විසින් ඉල්ලීමක් සිදුකර *ALJ* විසින් කාලසීමාව නියමිත දිනයකට කල් දැමීම හෝ පාසල් දිස්ත්‍රික්කය මගින් ඉල්ලුම් කළ පරිදි විසඳීමේ කාලසීමාව අවසන් වූ පසුව දින දර්ශනයට අනුව දින 45ක් ඇතුලත ලිඛිත තීරණයක් නිකුත් කළ යුතුය. රජයේ පැමිණිලි කිරීම සහ අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිලි කිරීම, යෝජනා ඉදිරිපත් කිරීම සහ විභාග කිරීම් සම්බන්ධව කරුණු වැඩිදුරටත් පහතින් විස්තර කර ඇත.

## හදාවඩා ගැනීම සම්බන්ධව ප්‍රාන්ත පැමිණිලි ක්‍රියාවලි

**34 *CFR* §300.151**

සාමාන්‍ය

මේ සඳහා *MDE* සතුව ලිඛිත ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය (විශේෂ අධ්‍යාපනය සම්බන්ධව ඇති පරිපාලන නීති බලන්න, 340.1701a, 340.1851-1853 නීති):

1. රජයේ පැමිණිල්ලක් විසඳීම සම්බන්ධව සංවිධානයකට හෝ වෙනත් රටකින් පැමිණි පුද්ගලයෙකුට පැමිණිල්ලක් ගොනු කිරීමට ඉඩ ලබා දී ඇත¦
2. පැමිණිල්ලක් ගොනු කිරීම
3. දෙමව්පියන් පුහුණු කිරීමේ සහ තොරතුරු මධ්‍යස්ථාන, ආරක්ෂණ සහ නීතිමය ආයතන ස්වාධීන ජීවන මධ්‍යස්ථාන සහ අනෙකුත් සුදුසු ආයතන දෙමාපියන්ට සහ වෙනත් උනන්දුව දක්වන පුද්ගලයින්ට රජයේ පැමිණිලි කිරීමේ ක්‍රියාවලිය පුළුල්ව ව්‍යාප්ත කිරීම සඳහා පවත්වාගෙන යනු ලැබේ.

සුදුසු සේවා ප්‍රතික්ෂේප වීම සම්බන්ධව පිළියම්

රජයේ පැමිණිල්ලක් විසඳීමේදී *MDE* මගින් සුදුසු සේවාවක් ලබාදීමට නොහැකි වුවහොත් *MDE* විසින් ඇමතිය යුතුය:

1. සුදුසු සේවාවක් ලබාදීමට නොහැකි වුවහොත් දරුවාගේ අවශ්‍යතාවය සපුරාලීමට සුදුසු නිවැරදි ක්‍රියාමාර්ගයන් සඳහන් කර ඇත¦ සහ
2. ආබාධ සහිත සියලු දරුවන් සඳහා සුදුසු අනාගත සේවා ප්‍රතිපාදනය.

## ප්‍රාන්ත පැමිණිලි ක්‍රියාවලියේ අවම ක්‍රියාපටිපාටිය

**34 *CFR* §300.152**

කාලසීමාව¦ අවම ක්‍රියාපටිපාටිය
විශේෂ අධ්‍යාපනය පිළිබඳ කාර්යාලය [*Office of Special Education (OSE)*] යටතේ *MDE* මඟින් පැමිණිලි ගොනු කිරීමෙන් පසු දින 60 ක කාලසීමාවක් සම්බන්ධව රජයේ පැමිණිලි කිරීමේ පටිපාටිය තුළ ඇතුලත් වනු ඇත:

1. *MDE* මඟින් පරීක්ෂණය අවශ්‍ය බව තීරණය කළහොත් ස්ථානීය පරීක්ෂණයක් සිදු කරනු ලබයි¦
2. පැමිණිල්ලේ ඇති චෝදනා සම්බන්ධයෙන් වාචිකව හෝ ලිඛිතව අතිරේක තොරතුරු ඉදිරිපත් කිරීමට පැමිණිලිකරුවන්ට අවස්ථාවක් ලබාදීම¦
3. අවම වශයෙන්, පාසල් දිස්ත්‍රික්කයට හෝ පොදු ඒජන්සියකට පැමිණිල්ලට ප්‍රතිචාර දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දීම: (ඒ) සහභාගී වන ආයතනයේ විකල්ප ක්‍රමයකින් පැමිණිල්ල විසඳීමට යෝජනා ඉදිරිපත් කිරීම¦ සහ(බී) පැමිණිල්ල ගොනු කළ දෙමාපියන්ට අවස්ථාවක් ලබාදීම සහ සහභාගී වන ආයතනය කැමැත්තෙන්ම මැදිහත් වීමට එකඟ වීම¦
4. පාසල් දිස්ත්‍රික්කය හෝ වෙනත් පොදු ඒජන්සිය ක් විසින් *IDEA*
5. හි බී කොටසේ අවශ්‍යතාවන් උල්ලංඝනය කිරීම යන්න පිළිබඳව සියලුම අදාළ තොරතුරු සමාලෝචනය කිරීම සහ ස්වාධීන තීන්දුවක් ලබා දීම¦ සහ
6. පැමිණිල්ලේ සඳහන් කර ඇති සෑම චෝදනාවක් සඳහා සහ අඩංගු කරුණු සම්බන්ධව පැමිණිලිකරුට ලිඛිත තීන්දුවක් නිකුත් කිරීම: (ඒ) කරුණු සහ නිගමනය සොයා බැලීම¦ සහ (බී) *MDE* හි අවසන් තීන්දුවට හේතු.

කාලය දීර්ඝ කිරීම¦ අවසාන තීන්දුව¦ ක්‍රියාත්මක කිරීම
ඉහතින් සඳහන් කළ *MDE* හි ක්‍රියාපටිපාටිය එසේම විය යුතුය:

1. දින දර්ශනයට අනුව දින 60ක කාලසීමාව දීර්ඝ කිරීම සඳහා අවසර ලබා දෙන්නේ නම්: (ඒ) යම් රාජ්‍ය පැමිණිල්ලක් සම්බන්ධව කිසියම් සුවිශේෂී තත්ත්වයක් පවතී නම්¦ හෝ (බී) දෙමාපියන් සහ පාසල් දිස්ත්‍රික්කය හෝ වෙනත් පොදු ඒජන්සියක් මැදිහත්වීමෙන් කාරණය විසඳීමට කාලය දීර්ඝ කිරීමට ස්වෙච්ඡාවෙන් එකඟවීම.
2. මේ සමගම අවශ්‍යනම් *MDE* මඟින් අවසාන තීරණය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට ඇතුලත් කිරීම සඳහා ක්‍රියා පටිපාටිය: (ඒ) තාක්ෂණික සහය සම්බන්ධව කාර්යයන්¦ (බී) සාකච්ඡා¦ සහ (සී) එකඟවීම ලබාගැනීම සඳහා නිවැරදි ක්‍රියා මාර්ගය.

රජයේ පැමිණිලි සහ නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාග කිරීම්
**අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොනු කිරීම** මාතෘකාව යටතේ විස්තර කර ඇති පරිදි නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාගය සඳහා වූ විෂය කරුණක් වන ලිඛිත රජයේ පැමිණිල්ලක් ලැබුණි නම් හෝ රජයේ පැමිණිල්ලක එක් ප්‍රශ්නයක් හෝ කිහිපයක් නඩු විභාගයේ කොටස් වූ නිසා රජයේ පැමිණිල්ල පසෙකින් තැබීම හෝ නඩු විභාගය අවසන් වීමට පෙර නඩු විභාගය මගින් රජයේ පැමිණිල්ලේ යම් කොටසක් විභාග කර තිබීම. නිසි ක්‍රියාපටිපාටි පිළිබඳ විභාග කිරීමේ දී ඇතුළත් නොවූ රජයේ පැමිණිල්ලේ ඕනෑම කොටසක් ඉහත විස්තර කර ඇති කාලසීමාව සහ ක්‍රියාපටිපාටිය භාවිතාකර විසඳිය යුතුය.

නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාගය තුල අදාල පාර්ශවයන්ට (ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය) සම්බන්ධව මුලින් සඳහන් කළ රජයේ පැමිණිල්ලෙහි යම් ප්‍රශ්නයක් ඉදිරිපත් වූයේ නම් එම ප්‍රශ්නය සම්බන්ධයෙන් වූ නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු තින්දුව බැඳී පවතින අතර *MDE* විසින් පැමිණිලිකරුට එම නඩු තීන්දුව බැඳී පවතින බවට දැනුවත් කළ යුතුය.

පාසල් දිස්ත්‍රික්කයක් හෝ වෙනත් පොදු ඒජන්සියක් පැමිණිල්ල සම්බන්ධව නිසි ක්‍රියාපටිපාටියේ විභාග කිරීමේ තිරණයක් ගැනීමට අසමත් වුවහොත් *MDE* විසින් විසඳිය යුතුය.

### රජයේ පැමිණිලි ඉදිරිපත් කිරීම

**34 *CFR* §300.153**
ඉහත සඳහන් ක්‍රියා පටිපාටියට අනුව සංවිධානයක් හෝ පුද්ගලයෙකු විසින් අත්සන් කරන ලද ලිඛිත රජයේ පැමිණිල්ලක් ගොනු කළ හැක.

රජයේ පැමිණිල්ලෙහි ඇතුළත් විය යුතු කරුණු:

1. පාසල් දිස්ත්‍රික්කයක් හෝ වෙනත් පොදු ඒජන්සියක් විසින් උල්ලංඝනය කර ඇති බවට ප්‍රකාශය ක්:
   a. විශේෂ අධ්‍යාපනය සඳහා වන පරිපාලන නීති වල වර්තමාන ප්‍රතිපාදන;
   b. 1976 *PA* [*Public Act* - පොදු පනත] 451, *MCL* [*Michigan Compiled Laws* - මිචිගන් සම්පාදිත නීති] 380.1 හා ඊළඟට, විශේෂ අධ්‍යාපන වැඩසටහන් සහ සේවාවන් එය අදාළ වන පරිදි;
   c. ආබාධිත පුද්ගලයින් සඳහා වූ 2004, 20 *U.S.C.*, 33 වන පරිච්ඡේදයේ, 1400 සහ ඊළඟට ඇති අධ්‍යාපන පනතේ සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ පනත වන 34 *C.F.R.* 300 කොටසේ සහ 34 *C.F.R.* 303 කොටසේ ඇති; ප්‍රකාශය ට පදනම් වූ කරුණු;
   d. අන්තර් පාසල් දිස්ත්‍රික් සැලැස්ම;
   e. ඒක පුද්ගල අධ්‍යාපන වැඩසටහන් කණ්ඩායම වාර්තා, විභාග කිරීමේ කාර්යාලයේ තීරණයක්, විශේෂ අධ්‍යාපන වැඩසටහන් හෝ සේවාවන් සම්බන්ධයෙන් අධිකරණ තීන්දුව; හෝ
   f. *IDEA* යටතේ ෆෙඩරල් අරමුදල් සඳහා රාජ්‍ය අයදුම්පත.
2. පැමිණිලිකරුගේ අත්සන සහ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු; සහ
3. යම් නිශ්චිත දරුවෙකු සම්බන්ධව උල්ලංඝනය කිරීමක් නම්:
   a. දරුවාගේ නම සහ දරුවාගේ ලිපිනය;
   b. දරුවා ඇතුලත් වන පාසැලේ නම;
   c. නිවාස අහිමි වූ දරුවකුගේ හෝ තරුණයෙකුගේ තත්ත්වයක් නම්, අදාළ දරුවා සම්බන්ධ කර ගැනීමේ තොරතුරු, සහ දරුවා ඇතුලත් වන පාසැලේ නම;
   d. ගැටළුව සම්බන්ධයෙන් කරුණු ඇතුළත් වූ දරුවාගේ ගැටළුවේ ස්වභාවය පිළිබඳ විස්තරයක්; සහ
   e. පැමිණිල්ල ඉදිරිපත් කරන අවස්ථාවේ දී පැමිණිල්ලේ පැමිණිල්ල ඉදිරිපත් කරන පාර්ශවය වෙත දැනුම් දී ඇති සහ එම ගැටළුවට විසඳුමක් යෝජනා කිරීම.

*MDE* හෝ *ISD* [*Intermediate School District* - අන්තර් පාසල් දිස්ත්‍රික්කය] වෙත ලැබුනු පැමිණිල්ලේ සඳහන් කළ උල්ලංඝනය පැමිණිල්ල ලැබුණු දිනයට අවුරුද්දකට වඩා වැඩි කාලයක් ගත නොවී තිබිය යුතුය.

රජයේ පැමිණිල්ලක් ඉදිරිපත් කරන පාර්ශවය විසින් *OSE* වෙත පැමිණිල්ලක් ගොනු කරන එම අවස්ථාවේදීම එම පාර්ශවය විසින් පැමිණිල්ලේ පිටපතක් පාසල් දිස්ත්‍රික්කයට හෝ දරුවාට සේවය කරන පොදු ඒජන්සියකට ඉදිරිපත් කළ යුතුය.

රජයේ පැමිණිල්ලක් ගොනු කිරීම සඳහා *MDE* විසින් ආදර්ශ ආකෘති අයදුම්පත් පත්‍රයක් සකස් කර ඇත. ආදර්ශ ආකෘති අයදුම්පත් පත්‍රය [OSE වෙබ්අඩවියෙන්](www.michigan.gov/specialeducation) ලබා ගත හැකිය (www.michigan.gov/specialeducation). ඔබට ආදර්ශ ආකෘති අයදුම් පත්‍රය භාවිතා කිරීමට අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, රජයේ පැමිණිල්ලක් සම්බන්ධයෙන් අයදුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු පැමිණිල්ලෙහි අඩංගු විය යුතුය (ඉහත 1-4 බලන්න).

## අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල කිරීමේ පරිපාටිය

### අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල ගොනු කිරීම

**34 *CFR* §300.507**

සාමාන්‍ය
ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය විසින් යෝජනාවේ කිසියම් කරුණක් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොනු කිරීම හෝ ඔබේ දරුවා හඳුනා ගැනීම, ඇගයීම හෝ අධ්‍යාපනික ස්ථානගත කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා මූලික වීම හෝ ඔබේ දරුවාට *FAPE* ප්‍රතිපාදනය ප්‍රතික්ෂේප කිරීම.

ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය විසින් අවුරුදු දෙකකට නොවැඩි කාලයක් දැන සිටි උල්ලංඝනය කිරීමක් ගැන නිසි ක්‍රියාවලිය සම්බන්ධව චෝදනාවක් ඉදිරිපත් කළ යුතු වීම හෝ අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල සඳහා පදනම් වූ කරුණු සම්බන්ධව ඉදිරිපත් කර තිබූ චෝදනා ගැන දැන සිටීම.

කාලසීමාව තුළ ඔබට අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොනු කළ නොහැකි නම් ඉහත කාල සටහන ඔබට අදාළ නොවේ:

1. පැමිණිල්ලේ සඳහන් ගැටළු නිරාකරණය කර ඇති බවට පාසල් දිස්ත්‍රික්කය විශේෂයෙන් වැරදි ලෙස ප්‍රකාශයක් කර තිබීම¦ හෝ
2. *IDEA* හි බී කොටස හෝ සී කොටස යටතේ ඔබට සැපයිය යුතු විස්තර පාසල් දිස්ත්‍රික්කය විසින් අත්හිටුවීම.

දෙමාපියන් සඳහා තොරතුරු
ඔබ විසින් තොරතුරු ලබා ගැනීමට ඉල්ලුම් කර තිබේ නම් හෝ ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය විසින් අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොනු කර තිබේ නම් පාසල් දිස්ත්‍රික්කය විසින් ප්‍රදේශය තුළ නොමිලේ හෝ වියදම් අඩු නීතිමය සහ වෙනත් අදාළ සේවාවන් පිළිබඳව ඔබව දැනුවත් කළ යුතුය.

### අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල

**34 *CFR* §300.508**

සාමාන්‍ය
නඩු විභාගයක් ඉල්ලා සිටීම සඳහා ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය (හෝ ඔබේ නීතිඥවරයා හෝ පාසල් දිස්ත්‍රික් නීතිඥවරයා) *MDE* සමග අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොනු කළ යුතු අතර, අනෙක් පාර්ශවයට එහි පිටපතක් සැපයිය යුතුය. පහත ලැයිස්තුගත කර ඇති කරුණු සියල්ල පැමිණිල්ලේ සඳහන් විය යුතු අතර එය රහසිගතව තබාගත යුතුය.

පැමිණිල්ලේ අන්තර්ගතය
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලේ ඇතුළත් විය යුතු කරුණු:

1. දරුවාගේ නම¦
2. දරුවා පදිංචි ස්ථානයේ ලිපිනය¦
3. දරුවාගේ පාසලේ නම¦
4. නිවාස අහිමි වූ දරුවකු හෝ තරුණයෙකු නම්, අදාල දරුවා සම්බන්ධ කරගැනීමේ තොරතුරු, සහ දරුවාගේ පාසලේ නම¦
5. ගැටළුව සම්බන්ධ කරුණු ඇතුලත්වූ යෝජිත හෝ ප්‍රතික්ෂේප කළ ක්‍රියාවට අදාලව දරුවාගේ ගැටලුවේ ස්වභාවය පිළිබඳ විස්තරයක්¦ සහ

6. මෙම ගැටලුව විසඳීමට සදහා යෝජනා කරන ලද යෝජනාවේ ආකාරයට සහ එම අවස්ථාවේ දි ඔබට හෝ පාසල් දිස්ත්‍රික්කයට එය ලබා ගත හැකි වීම.

අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් විභාග කිරීමට පෙර දැනුම් දීමක් අවශ්‍ය ය
ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය (හෝ ඔබේ නීතිඥවරයා හෝ පාසල් දිස්ත්‍රික් නීතිඥවරයා) ඉහත සදහන් කරන ලද විස්තර වලට අනුව නිසි ලෙස අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොනු කරන තුරු ඔබට හෝ පාසල් දිස්ත්‍රික්කයට නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාගයක් නොපවත් වන්නේය. *MDE* සහ අනෙක් පාර්ශවය විසින් ලැබුණු විට අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් නිසි ලෙස ගොනු කර ඇත.

පැමිණිල්ල ප්‍රමාණවත් වීම
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල ඉදිරියට ගෙනයාම සඳහා එම පැමිණිල්ල ප්‍රමාණවත් යැයි සැලකිය යුතුය. ඉහතින් සඳහන් කරන ලද කරුණු වලට අනුව අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල තුල අදාල කරුණු ඇතුලත් නොවීම සම්බන්ධව පැමිණිල්ල ලැබූ දින දර්ශනයේ දින 15ක් ඇතුලත *ALJ* සහ අනෙකුත් පාර්ශවයන් සදහා (ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය විසින්) ලිඛිත දැනුවත් කිරීමක් කර නොතිබුණ නම් පමණක් නිසි ක්‍රියාවලිය සම්බන්ධ පැමිණිල්ල (ඉහත අවශ්‍යතා සපුරා ගැනීමට) ප්‍රමාණවත් බව තීරණය වේ.

දින දර්ශනයේ දින 5ක් ඇතුලත අදාල දැනුම් දීම ලැබුනු පාර්ශවය (ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය) විසින් අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල ප්‍රමාණවත් නොවන බවට තීරණය කිරීමෙන් අනතුරුව *ALJ* විසින් නිසි ක්‍රියාවලිය සම්බන්ධ පැමිණිල්ල සම්බන්ධව ඉහතින් සදහන් අවශ්‍යතාවයන් සපුරාලන්නේද නැද්ද යන්න සලකා බලා ඔබ සහ පාසල් දිස්ත්‍රික්කය වෙත හදිසි ලිඛිත දැනුවත් කිරීමක් සිදු කළ යුතුය.

පැමිණිල්ල සංශෝධනය කිරීම
ඔබට හෝ පාසල් දිස්ත්‍රික්කයට පැමිණිල්ල වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම්:

1. අනෙක් පාර්ශවය විසින් ලිඛිත වෙනස්කම් අනුමත කරනු ලබන අතර, පහත දැක්වෙන විසඳුම් සඳහා වන හමුවීම මගින් අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිලි විසඳීමට අවස්ථාව ලබා දීම¦ හෝ
2. නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාගය ඇරඹීමට නියමිත දිනට දින 5කට නොඅඩු කාලයකට පෙර *ALJ* විසින් වෙනස්කම් සඳහා අවසර ලබා දෙනු ලැබේ.

අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලෙහි පැමිණිලි පාර්ශවය (ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය) විසින් වෙනස් කිරීම් සිදු කරන්නේ නම් සංශෝධිත පැමිණිල්ල ගොනු කළ දින සිට (යෝජනාව ලැබූ දින සිට දින දර්ශනයේ දින 15ක් ඇතුලත) විසඳුම් සඳහා වන හමුවීම සදහා වූ කාලසටහන සහ (යෝජනාව ලැබූ දින සිට දින දර්ශනයේ දින 30ක් ඇතුලත) විසදීමේ ක්‍රියාවලිය සදහා කාලය නැවත ආරම්භ වේ.

අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් සදහා පාසල් දිස්ත්‍රික්කය මගින් ලබාදෙන ප්‍රතිචාරය
**පූර්ව ලිඛිත දැනුම් දීම** මාතෘකාව යටතේ විස්තර කර ඇති පරිදි පාසල් දිස්ත්‍රික්කය විසින් ඔබට පූර්ව ලිඛිත දැනුම්දීමක් කර නොතිබුණි නම් නිසි ක්‍රියාවලිය සම්බන්ධ පැමිණිල්ලේ විෂය කරුණු වලට අදාලව අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල කළ දින සිට දින දර්ශනයේ දින 10ක කාලය ඇතුලත පාසල් දිස්ත්‍රික්කය විසින් පහත කරුණු ඇතුලත් ප්‍රතිචාරයක් ඔබට ලබා දිය යුතුය:

1. අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලේ දී මතු කරන ලද ක්‍රියාමාර්ග ගැනීමට පාසල් දිස්ත්‍රික්කය යෝජනා කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම ගැන පැහැදිලි කිරීමක්¦
2. ඔබේ දරුවාගේ *IEP* කණ්ඩායම සලකා බැලූ වෙනත් විකල්ප විස්තර සහ එම විකල්ප ප්‍රතික්ෂේප කරනු ලැබීමට හේතු වූ කරුණු පිළිබඳ විස්තරයක්¦
3. යෝජිත හෝ ප්‍රතික්ෂේප කරන ලද ක්‍රියාමාර්ගයන් සඳහා පදනමක් ලෙස පාසල් දිස්ත්‍රික්කය විසින් භාවිතා කළ එක් එක් ඇගයීම් ක්‍රියාවලිය, තක්සේරු කිරීම, සඳහන් කර ගැනීම හෝ වාර්තා කිරීම සම්බන්ධ විස්තරයක්¦ සහ

4. පාසල් දිස්ත්‍රික්කය මගින් යෝජනා කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා අදාළ වන වෙනත් සාධක පිළිබඳ විස්තරයක්.

ඉහත අංක 1-4 හි සඳහන් තොරතුරු සැපයීම සඳහා ඔබගේ අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල ප්‍රමාණවත් නොවන බවට පාසලේ දිස්ත්‍රික්කය මගින් නොසලකයි.

අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල සඳහා වෙනත් පාර්ශවයේ ප්‍රතිචාරයන්
ඉහත සඳහන් **අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් සඳහා පාසල් දිස්ත්‍රික්කය මගින් ලබාදෙන ප්‍රතිචාරය** උප-මාතෘකාව යටතේ සදහන් කර ඇති කරුණු හැර පැමිණිල්ල ලැබූ දින සිට දින දර්ශනයේ දින 10ක කාලයක් ඇතුලත නිසි ක්‍රියාවලිය සම්බන්ධ පැමිණිල්ල අදාල වන පාර්ශ්ව විසින් විශේෂයෙන් අවධානය යොමු කළ පැමිණිල්ලේහි ප්‍රශ්න පිළිබඳ ප්‍රතිචාරයක් අනෙක් පාර්ශවයට ලබා දිය යුතුය.

## ආදර්ශ ආකෘති අයදුම්පත් පත්‍රය

**34 *CFR* §300.509**
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොනු කිරීමට ඔබගේ පහසුව සදහා *MDE* විසින් ආදර්ශ ආකෘති අයදුම්පත් පත්‍රයක් සකස් කර ඇත. *MDE* ආදර්ශ ආකෘති අයදුම්පත් පත්‍රය භාවිතා කිරීම ඔබට අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් කිරීමේදී ඉදිරිපත් පැමිණිල්ල සඳහා අවශ්‍ය තොරතුරු අඩංගු විය යුතුය. ආදර්ශ ආකෘති අයදුම් පත්‍රය *OSE* වෙබ්අඩවියෙන් ලබා ගත හැකිය (www.michigan.gov/specialeducation).

(සටහන: අනෙක් පාර්ශවය විසින් පැමිණිල්ලේ ප්‍රමාණවත් විවාද කරන්නේ නම්, ආදර්ශ ආකෘති අයදුම් පත්‍රය භාවිතා කිරීම *ALJ* විසින් පැමිණිල්ල ප්‍රමාණවත් වන බවට තීරණය කිරීම සඳහා සහතික නොවේ

## අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් කිරීම සහ විභාගය කිරීම පවත්වන අතරතුර දරුවාගේ ස්ථානගත කිරීම

**34 *CFR* §300.518**
**ආබාධිත තත්වය සහිත දරුවන් හික්මවීම** මාතෘකාව යටතේ දක්වා ඇති කරුණු හැර, *MDE* මගින් විසඳීමේ ක්‍රියාවලිය සිදුකරන කාලය ඇතුලත අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල ගොනු කළ පසු සහ අනෙක් පාර්ශවය වෙත දැනුම් දීමෙන් පසු නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාගයේ අපක්ෂපාතී තීන්දුවක් ලැබෙන තුරු හෝ උසාවි කටයුතු සිදුවන අතරතුර ඔබ සහ පාසල් දිස්ත්‍රික්කය වෙනත් ආකාරයකින් එකග වන්නේ නම් පමණක් ඔබගේ දරුවා හෝ දැරිය වර්තමාන අධ්‍යාපන කටයුතු කරන ස්ථානයේ සිටිය යුතුය.

අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල රජයේ පාසලට ඇතුලත් කිරීමේ ක්‍රියාවලිය සඳහා වූ මූලික අයදුම්පත සම්බන්ධව නම් එවැනි ක්‍රියාවලියන් අවසන් වන තෙක් ඔබගේ නිසි අවසරය මත ඔබේ දරුවා පොදු රාජ්‍ය පාසල් වැඩසටහනකට ඇතුළත් කළ යුතුය.

*IDEA* හි සී කොටසේ සේවාවන්ගෙන් බී කොටසේ සේවාවන් සදහා මාරු වූ සහ දරුවාගේ වයස අවුරුදු තුනක් සම්පූර්ණ වීම හේතුවෙන් තවදුරටත් සී කොටසේ සේවාවන් ලබාගැනීමට සුදුසුකම් නොමැති දරුවා සඳහා *IDEA* හි බී කොටසේ මූලික සේවාවන් ලබාගැනීමේ අයදුම්පතේහි අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් නම් දරුවාට ලබා දුන් සී කොටසේ සේවාවන් පාසල් දිස්ත්‍රික්කය විසින් ලබාදීම අවශ්‍ය නොවේ. *IDEA* හි බී කොටසේ සදහන් කරුණු සදහා දරුවා සුදුසු වන්නේ නම් සහ දරුවා සඳහා විශේෂ අධ්‍යාපනය ලැබිය යුතු බව ඔබ නිසි අවසරය පළ කරන්නේ නම් සහ අදාල සේවාවන් ලබන්නේ ප්‍රථම වතාවට නම්, කල් ගත වූ ක්‍රියාවලියේ ප්‍රතිඵලයන් සඳහා පාසල් දිස්ත්‍රික්කය විසින් ගැටළුවක් ඇති නොවූ එම විශේෂ අධ්‍යාපනය සහ අදාල (ඔබ සහ පාසල් දිස්ත්‍රික්කය යන දෙපාර්ශවයම එකග වන) සේවාවන් ලබා දිය යුතුය.

## විසඳුම් ක්‍රියාවලිය

**34 *CFR* §300.510**

විසඳුම් සඳහා වන හමුවීම
ඔබ සහ අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලෙහි කරුණු හදුනාගැනීමට අදාල දැනුමක් ඇති *IEP* කණ්ඩායමෙහි අදාල සාමාජිකයෙක් හෝ සමාජිකයින් ඇතුලත් විසඳුම් සඳහා වන හමුවීම පාසල් දිස්ත්‍රික්කය විසින් කැදවිය යුතුය. *MDE* විසින් අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල ගොනු කළ පසුව සහ එය පාසල් දිස්ත්‍රික්කය විසින් ලබාගත් පසුව, දින දර්ශනයේ දින 15ක කාලයක ඇතුලත දී විසඳුම් සඳහා වන හමුවීම කැඳවිය යුතුය. විසඳුම් සඳහා වන හමුවීම පවත්වනු ලබන තෙක් නිසි ක්‍රියාවලිය සම්බන්ධයෙන් නඩු විභාගය ඇරඹිය නොහැක. රැස්වීම

1. පාසල් දිස්ත්‍රික්කය වෙනුවෙන් තීරණ ගැනීමේ අධිකාරියක් ඇති පාසල් දිස්ත්‍රික්කයක නියෝජිතයෙකු සිටිය යුතුය; සහ
2. ඔබට නීතිඥවරයෙකුගේ අනුග්‍රහය නොලැබෙන්නේ නම් පමණක් පාසල් දිස්ත්‍රික්කය විසින් නීතිඥවරයෙකු ඉදිරිපත් කළ නොහැක.

රැස්වීම සඳහා සහභාගී වන ලෙස *IEP* කණ්ඩායමේ සාමාජිකයින් ඔබ සහ පාසල් දිස්ත්‍රික්කය විසින් තීරණය කරනු ලැබේ.

යෝජනා ඉදිරිපත් කිරීමේ රැස්වීමේ අරමුණ වනුයේ ඔබ විසින් ඉදිරිපත් කළ අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල සහ පැමිණිල්ල සදහා පදනම් වූ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම වන අතර එමගින් පාසල් දිස්ත්‍රික්කයට චෝදනාව විසඳීම සඳහා අවස්ථාවක් ලබාදීම.

විසඳුම් සඳහා වන හමුවීම අවශ්‍ය නොවේ නම්:

1. රැස්වීම අතහැර දැමීමට ඔබ හා පාසල් දිස්ත්‍රික්කය ලිඛිතව එකඟ වීම; හෝ
2. **මැදිහත්වීම** මාතෘකාව යටතේ, විස්තර කර ඇති පරිදි මැදිහත්වීමේ ක්‍රියාවලිය භාවිත කිරීමට ඔබ හා පාසල් දිස්ත්‍රික්කය එකඟ වේ.

යෝජනා ඉදිරිපත් කිරීමේ කාලය
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල කළ පසු දින දර්ශනයේ දින 30ක කාලයක් ඇතුලත පාසල් දිස්ත්‍රික්කය විසින් නිසි ක්‍රියාවලිය සම්බන්ධ පැමිණිල්ල (යෝජනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය අතරතුර) ඔබට අවශ්‍ය පරිදි විසදුමක් නොලැබුණි නම් නිසි ක්‍රියාවලිය සම්බන්ධ පැමිණිල්ල සම්බන්ධව නඩු විභාගය පවත්වයි.

පහත සඳහන් පරිදි, දින දර්ශනයේ දින 30ක යෝජනා ඉදිරිපත් කිරීමේ කාලය තුළ නඩු විභාගය මගින් ලබාගත් යම් අතිරේක කරුණුත් සමග දින දර්ශනයේ දින 30ක කාලය අවසානයේ දී අවසන් තීරණය ලබාදීම සඳහා වූ දින දර්ශනයේ දින 45ක කාලසටහන ආරම්භ වේ.

ඔබ සහ පාසල් දිස්ත්‍රික්කය යෝජනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය හෝ මැදිහත් වීම භාවිතා කිරීම අත්හැර දැමීමට දෙපාර්ශ්වයෙන්ම එකගතාවයක් පලකිරීම හැර ඔබ විසඳුම් සඳහා වන හමුවීම සදහා සහභාගී වීමට අසමත් වීම හේතුවෙන් යෝජනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සහ නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාගය පැවැත්වීම සදහා වූ කාලය ඔබ රැස්වීමට සහභාගි වන තෙක් ප්‍රමාද වීම සිදුවේ.

සාධාරණ වෑයමකින් සහ එවැනි ප්‍රයත්නයක් ලේඛනගත කිරීමෙන් පසු පාසල් දිස්ත්‍රික් විසඳුම් සඳහා වන හමුවීමට ඔබේ සහභාගිත්වය ලබා ගැනීමට නොහැකි වුවහොත්, දින දර්ශනයේ දින 30ක යෝජනා කාලය අවසානයේ දී *ALJ* විසින් ඔබේ අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල නිෂ්ප්‍රභා කිරීම සඳහා පාසල් දිස්ත්‍රික්කය

විසින් ඉල්ලීමක් කළ හැකිය. එවැනි උත්සාහයන් පිළිබඳ ලේඛනගත කිරීම තුල පාසලේ දිස්ත්‍රික් වාර්තාවේ කාලය හා ස්ථානය මත අන්‍යෝන්‍ය එකඟතාවයකට පත් කිරීමට උත්සාහ කිරීම ඇතුලත් විය යුතුය

1. ලබා ගත් සහ නිරත වූ දුරකථන ඇමතුම් වල විස්තරාත්මක සටහන් සහ ඒවායේ ප්‍රතිඵලයන්¦
2. ඔබට එවන ලද ලිපිවල පිටපත් සහ ලැබුණු ප්‍රතිචාර¦ සහ
3. ඔබේ නිවාසය සහ රැකියා ස්ථානය අධීක්ෂණය කිරීම සහ එම අධීක්ෂණයන්ගේ ප්‍රතිපල පිලිබඳ විස්තරාත්මක වාර්තාවක්

ඔබේ අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ලැබීමේදී පාසල් දිස්ත්‍රික්කය දින 15 ක් ඇතුලත යෝජනාව ඉදිරිපත් කිරීමේ රැස්වීම පවත්වාගෙන යාමට අසමත් වුවහොත් හෝ විසඳුම් සඳහා වන හමුවීම සඳහා සහභාගී වීමට අසමත් වුවහොත්, ඔබ විසින් දින දර්ශනයේ දින 45ක කාලවකවානුව සදහා නියම කරන ලද නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාගය ඇරඹීමට නියෝග කිරීමට *ALJ* ගෙන් ඉල්ලා සිටිය හැකිය

දින දර්ශනයේ දින 30ක විසදීමේ කාලයෙහි වෙනස් කිරීම

විසඳුම් සඳහා වන හමුවීම අත්හිටුවීම සඳහා ඔබ හා පාසල් දිස්ත්‍රික්කය ලිඛිතව එකඟ වෙත් නම් නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාගය සඳහා වූ දින දර්ශනයේ දින 45ක කාලසටහන ඊළඟ දවසේ සිට ආරම්භ වේ.

මැදිහත්වීම හෝ විසඳුම් සඳහා වන හමුවීම ආරම්භ වීමෙන් පසු සහ දින 30 ක දින දර්ශන කාලය අවසන් වීමට පෙර ඔබ හා පාසල් දිස්ත්‍රික්කය එකඟතාවයක් නොලැබෙන බව ලිඛිතව එකඟ වෙත් නම් නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාගය සඳහා වූ දින දර්ශනයේ දින 45ක කාලසටහන ඊළඟ දවසේ සිට ආරම්භ වේ.

ඔබ හා පාසල් දිස්ත්‍රික්කය මැදිහත්වීමේ ක්‍රියාවලිය භාවිතා කිරීමට එකඟ වේ නම්, දින 30ක දින දර්ශන යෝජනාව අවසානයේ, එකඟතාවයක් ඇති වන තෙක් මැදිහත්වීම දිගටම පවත්වා ගැනීමට පක්ෂ දෙකම ලිඛිතව එකඟ විය හැකිය. කෙසේ වෙතත්, ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය පසුව මැදිහත්වීමේ ක්‍රියාවලියෙන් ඉල්ලා අස්කර ගන්නේ නම්, නිසි ක්‍රියාවලිය සම්බන්ධ නඩු විභාගය සඳහා වූ දින දර්ශනයේ දින 45ක කාලසටහන ඊළඟ දවසේ සිට ආරම්භ වේ.

නිරවුල් කිරීමේ ලිඛිත ගිවිසුම

විසඳුම් සඳහා වන හමුවීමකදී ආරවුලකට විසඳුමක් ලැබුණහොත්, ඔබ හා පාසල් දිස්ත්‍රික්කය විසින් නීත්‍යානුකූලව බැඳී ඇති ගිවිසුමකට ඇතුල් විය යුතුය, එනම්:

1. ඔබ විසින් සහ පාසල් දිස්ත්‍රික්කය බැඳීමට බලය ඇති නියෝජිතයකු විසින් අත්සන් කිරීම¦ සහ
2. ඕනෑම ප්‍රාන්ත අධිකරණයකට (මෙම වර්ගයේ නඩු විභාග කිරීමට බලය ඇති ප්‍රාන්ත උසාවියකට) හෝ එක්සත් ජනපදයේ දිස්ත්‍රික් උසාවියක් තුළ බලාත්මක කිරීම සම්බන්ධයෙන් නිසි බලයක් ඇත.

ගිවිසුම සමාලෝචන කිරීමේ කාලය

විසඳුම් සඳහා වන හමුවීම් ප්‍රතිඵලයක් වශයෙන් ඔබ හා පාසල් දිස්ත්‍රික්කය සමඟ ගිවිසුමකට අවතීර්ණ වුවහොත්, එක් පාර්ශවයක් (ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය) විසින් ව්‍යාපාරික දින 3 කාලය තුළ ඔබ සහ පාසල් දිස්ත්‍රික්කය අත්සන් කළ ගිවිසුම අවලංගු කළ හැකිය

## අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිලි සම්බන්ධ නඩු විභාගය

### අපක්ෂපාතී අදාළ ක්‍රියාවලි සඳහා වන විභාග කිරීම්

**34 *CFR* §300.511**

සාමාන්‍ය
අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොණු කල ඕනෑම අවස්ථාවක, ඔබට හෝ මතවාදයට සම්බන්ධ පාසල් දිස්ත්‍රික්කයට **අදාළ ක්‍රියාවලි පිළිබඳ පැමිණිල්ල** සහ විසඳුම් **ක්‍රියාවලිය** කාණ්ඩ හි විස්තර කරන ක්‍රියාවලි අනුගමනය කිරීමෙන් පසුව අදාළ ක්‍රියාවලි සම්බන්ධ සාධාරණ නඩු විභාගයක් සඳහා අවස්ථාවක් අනිවාර්යයෙන් තිබිය යුතුය.

අපක්ෂපාතී පරිපාලන නීති විනිසුරුවරයා
අවම වශයෙන්, *ALJ*:

1. *MDE* හෝ දරුවාගේ අධ්‍යාපනය හෝ රැකවරණය සම්බන්ධ පාසල් දිස්ත්‍රික්කයේ හෝ සේවා නියුක්තිකයෙක් නොවිය යුතුයි. කෙසේ වුවද *ALJ* ලෙස සේවය කිරීමට ඔහුට/ඇයට කාර්යාංශය මඟින් ගෙවීම් සිදු කල පමණින් එම පුද්ගලයා තනිකරම කාර්යාංශයේ සේවා නියුක්තිකයෙකු නොවේ.
2. නඩු විභාගයේදී *ALJ* ගේ වාස්තවිකත්වයට බලපාන පෞද්ගලික කෝ වෘත්තිමය අභිරුචියක් නොතිබිය යුතුය.
3. *IDEA* හි ප්‍රතිපාදන, සහ *IDEA* ට අදාල වන සන්ධීය සහ රාජ්‍ය රෙගුලාසි, සහ සන්ධීය සහ රාජ්‍ය උසාවි මඟින් *IDEA* පි
4. ලිබඳ ඇති නීති අර්ථකතන පිළිබඳ දැනුවත් විය යුතු අතර ඒවා තේරුම් ගත යුතුය.
5. ගැලපෙන, සම්මත නීති භාවිතයට ගැලපෙන ලෙස නඩු විභාග පැවැත්වීමටත්, තීන්දු ගැනීමට සහ ලිවීමටත්, දැනුම සහ හැකියාව තිබිය යුතුය.

*ALJ* යනු පරිපාලන නීති සහ විභාග කිරීම් පිළිබඳ කාර්යාලය [*State Office of Administrative Hearings and Rules (SOAHR)*] හි සේවයේ නියුක්ත නීතිඥවරු වන අතර රජයේ වර්ගීකෘත සිවිල් සේවා නියුක්තිකයෝ වෙති. *ALJ* ලෙස සේවය කරන පුද්ගලයින්ගේ සුදුසුකම් සහිත ප්‍රකාශය ක් අඩංගු ලැයිස්තුවක් *MDE* විසින් (*SOAHR* හරහා) පවත්වා ගනියි.

අදාළ ක්‍රියාවලි සම්බන්ධ නඩු විභාගයේ විෂය කරුණු
අනෙක් පාර්ශවය එකඟ වුවහොත් මිස, අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලේ සඳහන්ව නැති කරුණු පිළිබඳ විමසීමක්, අදාළ ක්‍රියාවලි පිළිබඳ නඩු විභාගයේදී, අදාළ ක්‍රියාවලි පිළිබඳ නඩු විභාගය ඉල්ලා සිටින පාර්ශවයට (ඔබට හෝ පාසල් දිස්ත්‍රික්කයට) සිදු කල නොහැක.

නඩු විභාගයක් ඉල්ලා සිටීමේ කාල සීමාව
ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය, පැමිණිල්ලේ සඳහන් කරුණ/කරුණු පිළිබඳ දැනගත් හෝ දැනගත යුතු දිනයේ සිට වසර දෙකක් ඇතුලත ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය විසින් අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොනු කල යුතුය.

කාලසීමාවට පටහැනි අවස්ථා
පහත හේතු නිසා ඔබට අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොනු කිරීමට නොහැකි වූ විට උක්ත කාලසීමාව අදාල නොවේ.

1. ඔබේ පැමිණිල්ලේ ඔබ විසින් හුවාදක්වන ප්‍රශ්නය හෝ කරුණ විසඳූ ලෙස පාසල් දිස්ත්‍රික්කය විසින් විශේෂයෙන් වැරදි සහගත ලෙස විස්තර කල විට හෝ

2. ඔබ වෙත සැපයීමට අවශ්‍ය වූ, *IDEA* හි බී කොටසේ හෝ සී කොටසේ සඳහන් තොරතුරු පාසල් දිස්ත්‍රික්කය මඟින් අත්හිටවා ඇති විට.

## නඩු විභාග අයිතීන්

**34 *CFR* §300.512**

සාමාන්‍ය
අදාළ ක්‍රියාවලි සම්බන්ධ නඩු විභාගයට අදාළ ඕනෑම පාර්ශවයකට (විනය ක්‍රියාපටිපාටි වලට අදාල නඩු විභාග ඇතුලුව) පහත සඳහන් අයිතීන් ඇත.

1. ආබාධ සහිත දරුවන්ගේ ප්‍රශ්න පිළිබඳව විශේෂ දැනුම හෝ පුහුණුව සහිත පුද්ගලයින් සහ/හෝ නීතිඥවරයෙකු කැටුව ඒම සහ උපදෙස් ලබා ගැනීම.
2. සාක්ෂි ඉදිරිපත් කිරීම සහ අභියෝගයට ලක් කිරීම, සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීම සහ සාක්ෂිකරුවන් පැමිණීමට බලකිරීම.
3. නඩු විභාගයට අවම වශයෙන් ව්‍යාපාරික දින පහකට වත් පෙර අදාල පාර්ශවයට හෙළි නොකල සාක්ෂි නඩු විභාගයේදී ඉදිරිපත් කිරීම තහනම් කිරීම.
4. නඩු විභාගයේ ලිඛිත, හෝ ඔබේ කැමැත්ත පරිදි විද්‍යුත්, වචනයෙන් වචනය සහිත වාර්තාවක් ලබා ගැනීම සහ
5. ලිඛිත, හෝ ඔබේ කැමැත්ත පරිදි විද්‍යුත්, නඩු තීන්දු සහ තීරණ ලබා ගැනීම

අතිරේක තොරතුරු අනාවරණය කිරීම
අදාළ ක්‍රියාවලි සම්බන්ධ නඩු විභාගයට අවම වශයෙන් ව්‍යාපාරික දින පහකට පෙර, ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය මඟින් නඩු විභාගයේදී භාවිත කිරීමට අදහස් කරන, එම දිනය තෙක් සම්පූර්ණ කල සියලු ඇගයීම් සහ එම ඇගයීම් මත පදනම් වූ නිර්දේශ, ඔබ සහ පාසල් දිස්ත්‍රික්කය විසින් එකිනෙකාට අනාවරණය කල යුතුය.

මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අසමර්ථ වන ඕනෑම පාර්ශවයක්, අනෙකුත් පාර්ශවයේ නිසි අවසරයකින් තොරව නඩු විභාගයේදී අදාල ඇගයීම් සහ නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් වැළක්වීමට *ALJ* ට හැකියාව ඇත.

නඩු විභාගයේදී දෙමාපිය අයිතීන්
ඔබට පහත අයිතීන් ලබා දිය යුතුය.

1. ඔබේ දරුවා ඉදිරිපත් කිරීමට¦
2. නඩු විභාගය මහජනතාවට අනාවරණය කිරීමට¦ සහ
3. ඔබට සපයන නඩු තීන්දු සහ තීරණ, නඩු වාර්තාව ගාස්තුවකින් තොරව ලබා ගැනීමට

## නඩු විභාග තීරණ

**34 *CFR* §300.513**

පරිපාලන නීති විනිසුරුවරයාගේ තීරණ
ඔබේ දරුවා *FAPE* ලැබුවේද යන්න පිළිබඳ *ALJ* ගේ තීරණය සාධාරණ වටපිටාවක් මත පදනම් විය යුතුය.

පටිපාටිය උල්ලංඝනය කිරීමක් පිළිබඳ චෝදනා කිරීමකදී *ALJ* විසින් ඔබේ දරුවා *FAPE* නොලැබූ බව පහත සඳහන් පටිපාටිය අප්‍රමාණවත් බව මත සොයා ගනු ඇත.

1. ඔබේ දරුවාගේ *FAPE* සඳහා ඇති අයිතිය වැළක්වීම
2. ඔබේ දරුවාට *FAPE* ප්‍රතිපාදනය පිළිබඳ තීන්දු ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට ඔබට ඇති අවස්ථාව සැළකිය යුතු ලෙස වැළක්වීම හෝ

3. අධ්‍යාපනික ප්‍රතිලාභයක් අහිමි කිරීම

අන්තර් වාක්‍ය විග්‍රහය
*IDEA* හි බී කොටස (34 *CFR* §§300.536 සිට 300.500 දක්වා) යටතේ ඇති සන්ධීය රෙගුලාසි වල පටිපාටිගත සුරක්ෂිතතා අවශ්‍යතාවයන් වලට අනුකූල වීමට පාසල් දිස්ත්‍රික්කයකට බල කිරීමට *ALJ* ට ඇති හැකියාව වළක්වන පරිදි ඉහත විස්තර කල ප්‍රතිපාදන කිසිවක් අර්ථ දැක්විය නොහැක.

අදාළ ක්‍රියාවලි සම්බන්ධ නඩු විභාගයක් සඳහා වෙනම ඉල්ලීමක් කිරීම
*IDEA* හි බී කොටස (34 *CFR* §§300.536 සිට 300.500 දක්වා) යටතේ ඇති සන්ධීය රෙගුලාසි වල පටිපාටිගත සුරක්ෂිතතා කිසිවක්, දැනට ගොණු කර ඇති අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලකට පරිබාහිර කරුණක් සම්බන්ධයෙන් ඔබ වෙනම අදාළ ක්‍රියාවලි සම්බන්ධ පැමිණිල්ලක් ගොනු කිරීම වළක්වන ලෙස අර්ථ නොදැක්විය යුතුයි.

උපදේශන මණ්ඩලයට සහ සාමාන්‍ය මහජනතාවට සොයාගැනීම් සහ තීරණ දැනුම් දීම
පෞද්ගලිකව හඳුනාගත හැකි සියලු තොරතුරු මකා දැමීමෙන් පසු, *MDE*:

1. අදාළ ක්‍රියාවලි සම්බන්ධ නඩු විභාගයේ සොයාගැනීම් සහ තීරණ රාජ්‍ය විශේෂ අධ්‍යාපනික උපදේශන කමිටුවට සැපයිය යුතුය, සහ
2. එම සොයාගැනීම් සහ තීරණ මහජනතාවට ලබා දිය යුතුය.

## අභියාචනා

### අවසාන තීන්දුව¦ අභියාචනය¦ සාධාරණ විචාරය

**34 *CFR* §300.514**

අවසාන නඩු තීන්දුව
පහත විස්තර කරන පරිදි සිවිල් ක්‍රියාවලියක් ගෙන හැර පෑමෙන් නඩු විභාගයට සම්බන්ධ ඕනෑම පාර්ශවයක් (ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය) අභියාචනා කිරීම හැර අදාළ ක්‍රියාවලි සම්බන්ධ නඩු විභාගයක තීරණය (විනය ක්‍රියාපටිපාටි වලට අදාල නඩු විභාග ඇතුලුව) අවසාන තීරණය වේ.

### නඩු විභාගයේ කාලසීමාව සහ අවකාශය

**34 *CFR* §300.515**

විසඳුම් සඳහා වන හමුවීම් සඳහා ඇති කැලැන්ඩර් දින 30 ඉක්ම ගොස් කැලැන්ඩර් දින 45 කට නොවැඩි කාලයක් හෝ, පහත සඳහන් උප මාතෘකා යටතේ විස්තර කර ඇති ගලපන ලද කාලසීමාව ඉක්ම ගොස් කැලැන්ඩර් දින 45 කට නොවැඩි කාලයක් ඉක්මවා නොයන බව *MDE* විසින් තහවුරු කල යුතුය. **කැලැන්ඩර් දින 30 ක බේරුම් කිරීමේ කාල පරිච්ඡේදයට සැකසුම්:**

1. නඩු විභාගයේ අවසාන තීරණයට ළඟා වී ඇති බව¦ සහ
2. තීරණයේ පිටපතක් එක් එක් පාර්ශවයන්ට තැපැල් කර ඇති බව

ඕනෑම පාර්ශවයක ඉල්ලීම මත ඉහත විස්තර කල කැලැන්ඩර් දින 45 කාල පරිච්ඡේදය ඉක්ම වූ විශේෂ දිගු, *ALJ* ට පිරිනැමිය හැක.

සෑම නඩු විභාගයක්ම ඔබට සහ ඔබේ දරුවාට සාධාරණව පහසු වේලාවක සහ ස්ථානයක පැවැත්විය යුතුය.

### සිවිල් ක්‍රියා, එම ක්‍රියා ගොණු කිරීමට කාල පරිච්ඡේදය ඇතුලත් කිරීම

**34 *CFR* §300.516**

සාමාන්‍ය
අදාළ ක්‍රියාවලි සම්බන්ධ නඩු විභාගයේ සොයාගැනීම් සහ තීරණ (විනය ක්‍රියාපටිපාටි වලට අදාල නඩු විභාග ඇතුලුව) හා එකඟ නොවන ඕනෑම පාර්ශවයකට (ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය) එම අදාළ ක්‍රියාවලි සම්බන්ධ නඩු විභාගයේ කරුණු සම්බන්ධයෙන් සිවිල් ක්‍රියාවලියක් ගෙන හැර පෑමට අයිතියක් ඇත. මෙම ක්‍රියාවලිය, පරිමිත අධිකරණයේ රාජ්‍ය උසාවියක (මෙවැනි නඩු ඇසීමට අධිකාරී බලය ඇති රාජ්‍ය උසාවියක්) හෝ එක්සත් ජනපදයේ දිස්ත්‍රික් උසාවියක හෝ ආරවුලේ ප්‍රමාණය නොසලකා ගෙන හැර පෑ හැක.

කාලයේ සීමිත බව
සිවිල් ක්‍රියාවලියක් ගොනු කිරීමට *ALJ* ගේ තීරණයේ දින සිට කැලැන්ඩර් දින 90 ක කාලයක් අදාල ක්‍රියාවලිය ගෙන එන පාර්ශවයට (ඔබ හෝ පාසල් දිස්ත්‍රික්කය) හිමිවේ.

අතිරේක විධික්‍රම
ඕනෑම සිවිල් ක්‍රියාවලියක, උසාවිය:

1. පරිපාලන උසාවියේ වාර්තා ලබා ගනී.
2. ඔබේ ඉල්ලීම හෝ පාසල් දිස්ත්‍රික්කයේ ඉල්ලීම මත අතිරේක සාක්ෂි වලට සවන් දෙයි.

3. සාක්ෂි වල අතිභාරය මත එහි තීරණය රඳා පවත්වන අතර උසාවිය තීරණය කරන වඩා සුදුසු සහනය ප්‍රධානය කරයි.

දිස්ත්‍රික් උසාවි වල අධිකරණ බලය
ආබාධ සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපන පනතේ (*IDEA*) B කොටස යටතේ ඇති ක්‍රියාවන් ආරවුලේ ප්‍රමාණය නොසලකා ක්‍රියාත්මක කිරීමට එක්සත් ජනපදයේ දිස්ත්‍රික් උසාවි වලට අධිකාරී බලය ඇත.

ගොඩනැංවීමේ නීතිය
*IDEA* හි බී කොටසේ ඇති කිසිවක් පහත සඳහන් කරුණ නිසා මත මිස එක්සත් ජනපද ව්‍යවස්ථාව, 1990 ආබාධ සහිත ඇමරිකානුවන්ගේ පනත, 1973 පුනරුත්ථාපන පනතේ පස්වන මාතෘකාව (504 වන කොටස), හෝ ආබාධ සහිත දරුවන්ගේ අයිතීන් ආරක්ෂා කරන අනෙකුත් සන්ධීය නීතීන් යටතේ ඇති අයිතීන්, ක්‍රියාමාර්ග සහ පිළියම් සීමා නොකළ යුතුයි. එනම්, *IDEA* හි බී කොටසේ ඇති, ඉහත දැක්වෙන නීති යටතේ සහනයක් බලාපොරොත්තුවෙන් සිවිල් ක්‍රියාමාර්ගයක් ගොනු කිරීමට පෙර ඉහත විස්තර කර ඇති අදාළ ක්‍රියාවලි ක්‍රිමාර්ග, *IDEA* හි බී කොටස යටතේ යම් පාර්ශවයක් කක්‍රියාවක් ගොනු කිරීමට අවශ්‍ය ප්‍රමාණයටම භාවිතා කළ යුතුය. මෙහි අර්ථය වන්නේ IDEA හි ඇති නීති සමඟ අතිච්ඡාදනය වන අනෙකුත් නීති යටතේ ඇති පිළියම් ඔබට තිබුනද සාමන්‍යයෙන් අනෙකුත් නීති යටතේ පිළිසරණක් ලබා ගැනීමට, කෙළින්ම උසාවියට යාමට ප්‍රථමයෙන් ඔබ විසින් *IDEA* යටතේ ඇති පරිපාලන පිළියම් (අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිලි, විභාග කිරීම්, විසඳුම් සඳහා වන හමුවීම් වැනි) පළමුව භාවිතා කළ යුතු බවයි.

## නීතිඥ ගාස්තු

### 34 *CFR* §300.517

සාමාන්‍ය
*IDEA* හි බී කොටස යටතේ ඇති ඕනෑම ක්‍රියාවක් හෝ ක්‍රියාපටිපාටියක් ඔබ විසින් ජයග්‍රහණය කළහොත්, උසාවිය, එහි අභිමතය පරිදි ඔබේ වියදම් වලින් කොටසක් සාධාරණ නීතිඥ ගාස්තුවක් ලෙස ඔබ වෙත ප්‍රධානය කල හැක.

*IDEA* හි බී කොටස යටතේ ඇති ඕනෑම ක්‍රියාවක් හෝ ක්‍රියාපටිපාටියක් ජයග්‍රහණය කරන රාජ්‍ය අධ්‍යාපන කාර්යාංශයට හෝ පාසල් දිස්ත්‍රික්කයට, උසාවිය, එහි අභිමතය පරිදි වියදම් වලින් කොටසක්, ඔබේ නීතිඥවරයා විසින් ගෙවිය යුතු සාධාරණ නීතිඥ ගාස්තුවක් ලෙස පහත සඳහන් අවස්ථාවන්හිදී ප්‍රධානය කල හැක. (ඒ) අර්ථ විරහිත, අසාධාරණ හෝ පදනමක් රහිත ලෙස උසාවිය හඳුනා ගත් පැමිණිල්ලක් හෝ නඩුවක් නීතිඥවරයා විසින් ගොණු කිරීම¦ හෝ (බී) නඩුව පවත්වාගෙන යාම අර්ථ විරහිත, අසාධාරණ හෝ පදනමක් රහිත ලෙස පැහැදිලිව හඳුනා ගත් නමුත් නීතිඥවරයා විසින් දිගටම නඩුව පවත්වාගෙන යාම¦ හෝ

හිරිහැර කිරීමට, අනවශ්‍ය ප්‍රමාදයක් ඇති කිරීමට, හෝ ක්‍රියාවේ හෝ ක්‍රියාපටිපාටියේ වියදම අනවශ්‍ය ලෙස ඉහළ දැමීමට වැනි ඕනෑම අවිධිමත් හේතුවක් සඳහා ඔබ අදාළ ක්‍රියාවලි සම්බන්ධි නඩු විභාගයක් හෝ පසු නඩුවක් ඉල්ලා සිටියහොත්, *IDEA* හි බී කොටස යටතේ ඇති ඕනෑම ක්‍රියාවක් හෝ ක්‍රියාපටිපාටියක් ජයග්‍රහණය කරන රාජ්‍ය අධ්‍යාපන කාර්යාංශයට හෝ පාසල් දිස්ත්‍රික්කයට, උසාවිය, එහි අභිමතය පරිදි වියදම් වලින් කොටසක්, ඔබ විසින් හෝ ඔබේ නීතිඥවරයා විසින් ගෙවිය යුතු සාධාරණ නීතිඥ ගාස්තුවක් ප්‍රධානය කල හැක.

ගාස්තු ප්‍රදානය
පහත සඳහන් ලෙස උසාවියක් මඟින් නීතිඥ ගාස්තු ප්‍රදානය කල හැක.

1. ක්‍රියාව හෝ නඩු ඇසීම සඳහා හේතු වූ, සැපයූ සේවයේ වර්ගය සහ තත්වය සඳහා ප්‍රජාවේ පවතින ගාස්තු මත නීතිඥ ගාස්තු පදනම් විය යුතුය. ප්‍රදානය කල ගාස්තු ගණනය කිරීමේදී ප්‍රසාද දීමනා හෝ ගුණාකාර යොදා නොගත යුතුය.
2. ලිඛිත නිරවුල් කිරීමේ ප්‍රතිඥාවකට පසුව ඔබ වෙත පිරිනමන සේවා සඳහා *IDEA* හි බී කොටස යටතේ ඇති ඕනෑම ක්‍රියාවක් හෝ ක්‍රියාපටිපාටියකට අදාල වියදම් නැවත පියවීමක් හෝ ගාස්තු ප්‍රදානයක් පහත අවස්ථාවල පිරි නොනැමේ.
   a. සිවිල් ක්‍රියාමාර්ග සඳහා වූ සන්ධීය නීති වල 68 වන නීතිය ප්‍රකාරව ඇති කාලය තුල හෝ අදාළ ක්‍රියාවලි සම්බන්ධ නඩු විභාගයක ක්‍රියාපටිපාටිය ආරම්භ වීමට කැලැන්ඩර් දින 10 කට වැඩි ඕනෑම කාලයකදී ප්‍රතිඥාව සිදුකළහොත්¦
   b. කැලැන්ඩර් දින 10ක් තුල ප්‍රතිඥාව පිළිනොගතහොත්¦ සහ
   c. ඔබ විසින් අවසානයේ ලබා ගත් සහනය, නිරවුල් කිරීමේ ප්‍රතිඥාවට ඔබට වඩා සතුටුදායක නොමැති බවට උසාවිය හෝ *ALJ* සොයාගතහොත්.

   නිරවුල් කිරීමේ ප්‍රතිඥාවක් ප්‍රතික්ෂේප කිරීමෙන් ඔබව අතිමහත් ලෙස සාධාරණීකරණය කළහොත් සහ ඔබ ජයග්‍රහණය කළහොත් මෙම සීමා කිරීම් නොසලකා නීතිඥ ගාස්තු සහ අදාල ගාස්තු ප්‍රදානයක් ඔබ වෙත ලබා දිය හැක.
3. පරිපාලන ක්‍රියාපටිපාටියක හෝ උසාවියේ ක්‍රියාවක ප්‍රතිපලයක් ලෙස මිස *IEP* කණ්ඩායම මුණගැසීමේ කිසිඳු අවස්ථාවකට ගාස්තු ප්‍රදානය නොකෙරේ.
4. පහත ශීර්ෂනාමය යටතේ විස්තර කරන පරිදි මැදිහත්වීමක් සඳහා ද ගාස්තු ප්‍රදානය නොකෙරේ, **මැදිහත්වීම**.
5. විසඳුම් සඳහා වන හමුවීම් යනු, පහත ශීර්ෂනාමය යටතේ විස්තර කරන පරිදි, **බේරුම් කිරීමේ හමුව**, පරිපාලන ක්‍රියාපටිපාටියක හෝ උසාවියේ ක්‍රියාවක ප්‍රතිපලයක් ලෙස රැස් වන හමුවක් ලෙස නොසලකන අතර මෙම නීතිඥ ගාස්තු ප්‍රතිපාදනය සඳහා අරමුණු කරන පරිපාලන ක්‍රියාපටිපාටියක් හෝ උසාවියේ ක්‍රියාවක් ලෙසද නොසැලකේ.

පහත සඳහන් කරුණු උසාවිය මඟින් සොයාගතහොත් *IDEA* හි බී කොටස යටතේ ඇති නීතිඥ ගාස්තු ප්‍රමාණය ගැලපෙන ලෙස උසාවිය අඩු කරයි.

1. ක්‍රියාව හෝ ක්‍රියාපටිපාටිය සිදුවන කාලසීමාව තුල ඔබ, හෝ ඔබේ නීතිඥවරයා, ආරවුල බේරුම් කිරීම අසාධාරණ ලෙස කල් දැමූ විට¦
2. සාධාරණ ලෙස හැකියාවෙන්, පිළිගැනීමෙන් සහ පළපුරුද්දෙන් සමාන නීතිඥවරුන් ප්‍රජාවේ සමාන සේවාවන් අයකරන පැයක ගාස්තුව අසාධාරණ ලෙස ඉක්මවන නීතිඥ ගාස්තු ප්‍රදානය සඳහා අනුමත කල විට¦
3. ක්‍රියාවේ හෝ ක්‍රියාපටිපාටියේ ස්වභාවය සැලකූ විට ගත කල කාලය සහ ලබා දුන් නීති සේවා අධික වූ විට¦ හෝ
4. පහත ශීර්ෂනාමය **අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල** යටතේ විස්තර කරන පරිදි, අදාළ ක්‍රියාවලි ඉල්ලීම් ප්‍රකාශනයේ ඇති නියමිත තොරතුරු ඔබව නියෝජනය කරන නීතිඥවරයා පාසල් දිස්ත්‍රික්කයට ලබා නොදුන් විට,

කෙසේ වුවද, රජය හෝ පාසල් දිස්ත්‍රික්කය ක්‍රියාවේ හෝ ක්‍රියාපටිපාටියේ අවසාන බේරුම් කිරීම අසාධාරණ ලෙස ප්‍රමාද කල බවට හෝ *IDEA* හි බී කොටසේ පටිපාටිගත සුරක්ෂිතතා ප්‍රතිපාදනය උල්ලංඝනය කිරීමක් සිදුවූ බවට උසාවිය සොයාගතහොත් උසාවිය මඟින් ගාස්තු අඩු කරනු නොලැබේ.

## ආබාධ සහිත දරුවන් හික්මවීමේ දී ක්‍රියා පිළිවෙල

### පාසල් කාර්ය මණ්ඩලයේ බලතල

**34 *CFR* §300.530**

අවස්ථාවෙන් අවස්ථාව නිර්ණය කිරීම
ආබාධ සහිත දරුවෙකු ශිෂ්‍ය කල්ක්‍රියාවේ පාසල් නීතියක් උල්ලංඝණය කල විට හික්මවීමට අදාලව පහත අවශ්‍යතාවයන්ට අනුව ස්ථානයේ වෙනසක් ගැලපේ දැයි තීරණය කිරීමේදී, පාසල් කාර්ය මණ්ඩලය අවස්ථාවෙන් අවස්ථාව මත පදනම්ව අනන්‍ය වාතාවරණයක් ලෙස සලකා බලයි.

සාමාන්‍ය
ආබාධ රහිත දරුවන් සඳහා ද ඔවුන් එවැනි ක්‍රියාමාර්ගයක් ගනු ලබන ප්‍රමාණයටම ආබාධ සහිත දරුවෙකු ශිෂ්‍ය කල්ක්‍රියාවේ පාසල් නීතියක් උල්ලංඝණය කල විට පාසල් කාර්ය මණ්ඩලය **පාසල් දින 10ට** නොවැඩි කාලයක් එක පෙළට, එම දරුවාව ඔහුගේ හෝ ඇයගේ වර්තමාන ස්ථානයෙන් වෙනස් ගැලපෙන තාවකාලික විකල්ප අධ්‍යාපනික වටාපිටාවකට ඉවත් කිරීම, වෙනත් වටාපිටාවකට ඉවත් කිරීම හෝ තාවකාලික ඉවත් කිරීමක් සිදු කරයි. ඉවත් කිරීම් මඟින් ස්ථානය වෙනස් වීමක් සිදු නොවන තාක් කල්, වෙනත් අවකල්ක්‍රියා සිදුවීම් සඳහා එම පාසල් වර්ෂය තුල **පාසල් දින 10ට** නොඅඩු කාලයක් එක පෙළට පාසල් කාර්ය මණ්ඩලයට එම දරුවාගේ අතිරේක ඉවත් කිරීම් පැවරිය හැක. (අර්ථ දැක්වීම සඳහා පහත **විනයානුකූල ඉවත් කිරීම් නිසා සිදු වන ස්ථානයේ වෙනසක්** බලන්න).

ආබාධ සහිත දරුවෙකු ඔහුගේ හෝ ඇයගේ වර්තමාන ස්ථානයෙන් ඉවත් කල පසු එම පාසල් වර්ෂය තුල මුළු **පාසල් දින 10ක්** පාසල් කාර්ය මණ්ඩලය විසින් එම පාසල් වර්ෂයේ පසුව එළැඹෙන ඕනෑම දින තුළ පහත දැක්වෙන උප ශීර්ෂය යටතේ ඇති සේවාවන් අවශ්‍ය ප්‍රමාණයට සැපයිය යුතුය. **සේවාවන්**.

අතිරේක අධිකාරය
පහත දැක්වෙන උප ශීර්ෂය **සේවාවන්** යටතේ ඇති සේවාවන් පාසල මඟින් දරුවාට සැපයීම හැරුණු කොට ගෙන ශිෂ්‍ය කල්ක්‍රියාවේ නීති උල්ලංඝණය කිරීමේ හැසිරීම දරුවාගේ ආබාධයේ විද්‍යාමානවීමක් (පහත **විද්‍යාමානවීම නිර්ණය**, බලන්න) නිසා නොවේ නම් සහ විනයානුකූල ව සිදු කරන ස්ථානයේ වෙනසක් **පාසල් දින 10ක්** එක පෙළට ඉක්ම යයි නම්, ආබාධ රහිත දරුවන්ට සිදු කරන එකම ආකාරයට සහ එකම කාලසීමාවක් පාසල් කාර්ය මණ්ඩලය විසින් විනය ක්‍රියාමාර්ග ආබාධ සහිත දරුවාට යෙදවිය හැක. එවැනි සේවාවන් සඳහා තාවකාලික විකල්ප අධ්‍යාපනික වටාපිටාව දරුවාගේ *IEP* කණ්ඩායම තීරණය කරයි.

සේවාවන්
වර්තමාන ස්ථානයෙන් ඉවත් කල ආබාධ සහිත දරුවෙකුට සැපයිය යුතු සේවාවන් තාවකාලික විකල්ප අධ්‍යාපනික වටාපිටාවේදී ලබා දිය හැක.

සමාන ආකාරයකට ඉවත් කරනු ලැබූ ආබාධ රහිත දරුවෙකුට සේවාවන් සැපයීමක් සිදු කරන්නේ නම් පමණක්, එම පාසල් වර්ෂය තුල **පාසල් දින 10ක්හෝ අඩු කාලයක්** ඔහුගේ හෝ ඇයගේ වර්තමාන ස්ථානයෙන් ඉවත් කල ආබාධ සහිත දරුවෙකුට පාසල් දිස්ත්‍රික්කය සේවා සැපයීම අවශ්‍ය වේ. විනය හේතු නිසා ඉවත් කරන ලද ආබාධ රහිත ශිෂ්‍යයන් හට මිචිගන් සේවාවන් සැපයීම අවශ්‍ය නොවේ.

**පාසල් දින 10ට වඩා** දරුවාගේ වර්තමාන ස්ථානයෙන් ඉවත් කරන ලද ආබාධ සහිත දරුවෙකු අනිවාර්යයෙන්:

1. වෙනත් වටපිටාවක සිට හෝ, දරුවාගේ *IEP* විසින් පිහිටවූ අභිමතාර්ථ කරා ප්‍රගතියක් ලබා ගැනීමට සහ සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාවට සහභාගී වීම සඳහා හැකිවන පරිදි අධ්‍යාපන සේවාවන් පවත්වාගෙන යා යුතුය; **සහ**
2. නැවත සිදු නොවන ලෙස හැසිරීම උල්ලංඝනය කිරීම අමතන පරිදි සැලසුම් කරන ලද, හැසිරීම් වලට මැදිහත් වන සේවාවන් සහ වෙනස්කම් සහ ක්‍රියාකාරී චර්යා රටා ඇගැයුම [*Functional Behavioral Assessment (FBA)*] ගැලපෙන පරිදි ලබා ගත යුතුය.

ආබාධ සහිත දරුවෙකු ඔහුගේ හෝ ඇයගේ වර්තමාන ස්ථානයෙන් ඉවත් කලේ එකම පාසල් වර්ෂය තුල **පාසල් දින 10ක්** දක්වා සහ වර්තමාන ඉවත් කිරීම එක පෙළට **පාසල් දින 10ක්** හෝ අඩු කාලයකට නම් **සහ** ඉවත් කිරීම ස්ථානයේ වෙනසක් (පහත අර්ථ දැක්වීම බලන්න) නොවේ නම්, අවම වශයෙන් දරුවාගේ ගුරුවරු එක් අයෙකුගෙන් හෝ උපදෙස් ලබාගෙන, වෙනත් වටපිටාවක හෝ දරුවාගේ *IEP* විසින් පිහිටවූ අභිමතාර්ථ කරා ප්‍රගතියක් ලබා ගැනීමට සහ සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාවට සහභාගී වීමට අවශ්‍ය කුමන සේවාවන් කෙතරම් ප්‍රමාණයකට දැයි පාසල් කාර්ය මණ්ඩලය මඟින් තීරණය කල යුතුය.

ඉවත් කිරීම ස්ථානයේ වෙනසක් නම් (පහත අර්ථ දැක්වීම බලන්න) වෙනත් වටපිටාවක හෝ දරුවාගේ *IEP* විසින් පිහිටවූ අභිමතාර්ථ කරා ප්‍රගතියක් ලබා ගැනීමට සහ සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාවට සහභාගී වීමට ගැලපෙන සේවාවන් දරුවාගේ *IEP* කණ්ඩායම තීරණය කරයි.

විද්‍යාමානවීම නිර්ණය
පාසල් නීතියක් උල්ලංඝනය කිරීමක් නිසා ආබාධිත දරුවෙක්ගේ ස්ථානයේ වෙනසක් කිරීමට ගත් ඕනෑම තීරණයකදී **පාසල් දින 10** ඇතුලත (එක දිගට **පාසල් දින 10ක්** හෝ අඩුවෙන් වන ඉවත්කිරීමක් සහ ස්ථානයේ වෙනසක් නොවන ඉවත් කිරීම් හැර) පාසල් දිස්ත්‍රික්කය, දෙමව්පියන්, සහ අදාළ *IEP* සාමාජිකයන් (පාසල් දිස්ත්‍රික්කය සහ දෙමව්පියන් විසින් තීරණය කරන පරිදි) දරුවාගේ ලිපි ගොනුවේ ඇති දරුවාගේ *IEP*, ගුරුවර විනිශ්චය කිරීම්, දෙමාපියන් විසින් සපයන ලද තොරතුරු යනාදී සියලුම අදාළ තොරතුරු විමර්ශනය කල යුතුය.එමගින් පහත කරුණු තීරණය කරනු ලැබේ

1. ඉහත තත්වයට දරුවාගේ ආබාධිත තත්වය හෝ එයට ඇති සෘජු සම්බන්ධතාවයක් හේතු වී ඇතිද යන්න; හෝ
2. දරුවාගේ *IEP* ක්‍රියාත්මක කිරීමට පාසැල් දිස්ත්‍රික්කය අසමත් වීමේ සෘජු ප්‍රතිඵලයක් ලෙස ඉහත තත්වය ඇතිවූවා ද යන්න.

පාසල් දිස්ත්‍රික්කය, දෙමාපියන් සහ දරුවාගේ *IEP* කණ්ඩායමේ අදාළ සාමාජිකයින් විසින් එම කොන්දේසි වලින් එකක් හෝ ඇති වී ඇති බවට තීරණය කරනු ලැබේ නම්, එම ක්‍රියා කලාපය දරුවාගේ ආබාධිත භාවය පිළිබිඹු වීමක් බව නිර්ණය කල යුතු වේ.

ඉහත තත්වයට හේතුව, පාසල් දිස්ත්‍රික්කය *IEP* ක්‍රියාත්මක කිරීමට අසමත් වීමේ සෘජු ප්‍රතිඵලයක් බව පාසල් දිස්ත්‍රික්කය, දෙමාපියන් සහ දරුවාගේ *IEP* කණ්ඩායමේ අදාල සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, පාසල් දිස්ත්‍රික්කය එම ඌනතා වලට පිළියම් යෙදීම සඳහා වහාම පියවර ගත යුතුය.

හැසිරීම, දරුවාගේ ආබාධිත තත්වය විද්‍යාමානවීමක් බව නිර්නය කිරීම
පාසල් දිස්ත්‍රික්කය, දෙමාපියන් සහ *IEP* කණ්ඩායමේ අදාල සාමාජිකයින්, හැසිරීම දරුවාගේ ආබාධිත භාවය විද්‍යාමානවීමක් බවට නිර්ණය කලහොත්, *IEP* කණ්ඩායම:

1. පාසල් දිස්ත්‍රික්කය, දරුවාගේ ස්ථානයේ වෙනසක් වීමට බලපෑ දරුවාගේ හැසිරීම ඇතිවීමට පෙර *FBA* සිදු නොකරන ලදනම් පමණක් *FBA* පරීක්ෂණයක් පවත්වන්න, සහ දරුවා සඳහා චර්යා රටා සඳහා මැදිහත්වීමේ සැලසුම [*Behavioral Intervention Plan (BIP)*] ක්‍රියාත්මක කරන්න¦ හෝ
2. *BIP* දැනටමත් සංවර්ධනය කර ඇත්නම්, *BIP* සමාලෝචනය කරන්න, හැසිරීම විසඳීමට අවශ්‍ය පරිදි, එය වෙනස් කරන්න.

පහත උප මාතෘකාව යටතේ දක්වා ඇති පරිදි හැරුනු කොට **විශේෂ අවස්ථා**, *BIP* හි නවීකරණයේ කොටසක් ලෙස දෙමව්පියන් සහ දිස්ත්‍රික්කය දරුවාගේ ස්ථානයේ වෙනසක් කිරීමට එකඟ නොවේනම් පමණක් පාසැල් දිස්ත්‍රික්කය දරුවා ඉවත් කරන ලද ස්ථානයටම ළමයා ආපසු ගෙන යා යුතුය.

විශේෂ අවස්ථා
හැසිරීම දරුවාගේ ආබාධය පිළිබිඹු කිරීමක් හෝ නොකිරීමක් වුවද, පාසල් කාර්ය මණ්ඩලය විසින් පාසැල් ශිෂ්‍යයෙක්ව දවස් 45ක් දක්වා අර්ධ තාවකාලික විකල්ප අධ්‍යාපනික වටාපිටාවකට සිසුන්ට ඉවත් කළ හැකිය. (ළමයාගේ *IEP* කණ්ඩායම විසින් තීරණය කරන ලද), සිසුවා:

1. පාසලට ආයුධයක් රැගෙන යාම හෝ පාසලේ හෝ පාසැල් භූමියේ ආයුධයක් තිබීම, හෝ *MDE* හෝ පාසල් දිස්ත්‍රික්කයේ අණසක යටතේ ඇති පාසලක ආයුධයක් තිබීම¦
2. පාසැලේ සිටියදී හෝ පාසැල් භූමියේදී හෝ *MDE* හෝ පාසල් දිස්ත්‍රික්කයේ අණසක යටතේ ඇති පාසලක, දැනුවත්ව පාලක ද්‍රව්‍ය විකිණීම හෝ ලබා ගැනීම හෝ දැනටමත් නීති විරෝධී ඖෂධ භාවිතා කිරීම¦ හෝ
3. පාසැලේ සිටියදී හෝ පාසැල් භූමියේදී හෝ *MDE* හෝ පාසල් දිස්ත්‍රික්ක අණසක යටතේ ඇති පාසලක තවත් පුද්ගලයෙකුට බරපතළ තුවාල සිදු කර තිබීම.

අර්ථ දැක්වීම්
*පාලක ද්‍රව්‍ය* යනු පාලක ද්‍රව්‍ය නිශ්චය කිරීමේ පනතේ(21 *U.S.C.* 812(සී)), 202 (සී) වගන්තියේI, II, III, IV, හෝ V උපලේඛන යටතේ ලැයිස්තුගත කර ඇති ඖෂධ හෝ වෙනත් ද්‍රව්‍යයකි.

*නීති විරෝධී ඖෂධ* යනු පාලක ද්‍රව්‍යයකි¦ නමුත් නීත්‍යානුකූලව හිමි හෝ බලයලත් සෞඛ්‍ය සේවකයෙකුගේ අධීක්ෂණය යටතේ භාවිතා කරන හෝ පනත යටතේ ඇති වෙනත් ඕනෑම අධිකාරියක් යටතේ හෝ වෙනත් ෆෙඩරල් නීතියක ප්‍රතිපාදන යටතේ හෝ නීත්‍යානුකූලව හිමි හෝ භාවිතා කරන පාලක ද්‍රව්‍ය ඇතුලත් නොවේ.

*බරපතළ තුවාල* එක්සත් ජනපද නීති සංග්‍රහයේ 18 වන මාතෘකාවේ 1365 වන වගන්තියේ (එච්.) වැනි උපවගන්තියේ (3) වැනි ඡේදය යටතේ zz බරපතළ කායික හිංසනයzz යන වචනයේ අර්ථය ඇත. (*A*. ඇමුණුම බලන්න.)

*ආයුධය* එක්සත් ජනපද නීති සංග්‍රහයේ 18 වන මාතෘකාවේ 930 වන වගන්තියේ (ජී) වැනි උපවගන්තියේ (2) ඡේදය යටතේ zz භයානක ආයුධයක් zz යන වචනයේ අර්ථය ඇත. (*A*. ඇමුණුම බලන්න.)

නිවේදනය
පාසල් නීතියක් උල්ලංඝනය කිරීම හේතුවෙන් දරුවා ඉවත් කිරීම මගින් දරුවාගේ ස්ථානයේ වෙනසක් කිරීමකට තීරණය කරන දිනයක දී, පාසැල් දිස්ත්‍රික්කය එම තීරණය දෙමාපියන්ට දැනුම් දිය යුතු අතර, පටිපාටිගත සුරක්ෂිතතා සහිත දැන්වීම දෙමව්පියන්ට ලබා දිය යුතුය.

## විනයානුකූල ඉවත් කිරීම් නිසා සිදු වන ස්ථානයේ වෙනසක්

**34 *CFR* §300.536**
ආබාධ සහිත දරුවෙකු වත්මන් අධ්‍යාපනික ස්ථාපනයෙන් ඉවත් කිරීම යනු: **ස්ථානයේ වෙනසක් කිරීම**¦

1. ඉවත් කිරීම පාසැල් දින 10 කට වැඩි කාලයක් වලංගු නම්¦ **හෝ**
2. රටාවකින් සමන්විත වන ඉවත් කිරීම් මාලාවකට දරුවා යටත්ව ඇත. එයට හේතු වන්නේ¦
   a. පාසැල් වර්ෂයක් තුළ ඉවත් කිරීම් ප්‍රමාණය පාසැල් දින 10 කට වඩා වැඩි වීම¦
   b. දරුවාගේ හැසිරීම සැලකිය යුතු ආකාරයකින් කලින් ඉවත් කිරීමට සිදු වූ සිදුවීම්වලට සමාන වීම¦ සහ
   c. එක් එක් ඉවත් කිරීමේ කාල සීමාව, දරුවා ඉවත් කර ඇති මුළු වාර ගණන සහ එකිනෙක ඉවත් කිරීම් අතර කාල පරතරය වැනි අතිරේක සාධක

ස්ථානයේ වෙනසක් වීම් වලට අදාළ ඉවත් කිරීමේ රටා පාසල් දිස්ත්‍රික්කය මගින් නිර්ණය කරනු ලබන්නේ අවස්ථාවෙන් අවස්ථාව සලකමින් වුවද, ඒවා අභියෝගයකට ලක්වුනොත්, නිසි ක්‍රියාවලියකින් සහ නඩු විභාගයකින් විමර්ශනයට ලක්වේ.

## පසුබිම තීරණය කිරීම

**34 *CFR* § 300.531**
**ස්ථානගත වෙනස්කිරීම්** හා ශීර්ෂ පාඨ මත ඉවත් කිරීම් **අතිරේක අධිකාරිය මත ඉවත් කිරීම්** සහ ඉහත **විශේෂ තත්ව** යටතේ ඉවත් කිරීම් සඳහා *IEP* කණ්ඩායම විසින් තාවකාලික විකල්ප අධ්‍යාපනික වටාපිටාව තීරණය කළ යුතුය.

## අභියාචනය

**34 *CFR* § 300.532**

සාමාන්‍ය
ආබාධ සහිත දරුවාගේ දෙමව්පියන් එකඟ නොවන්නේ නම් දරුවාගේ මව්පියන්ට නිසි ක්‍රියාදාම නඩු විභාගයක් අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් මගින් ඉල්ලා සිටීමට හැකිය (ඉහත බලන්න):

1. මෙම ප්‍රතිපාදන යටතේ ලබාදී ඇති ඕනෑම ස්ථානගත වෙනස්කිරීමකට අදාළ තීරණයක්¦ හෝ
2. ඉහත විස්තර කර ඇති විද්‍යාමානවීම නිර්ණය කිරීම.

දරුවාගේ වර්තමාන ස්ථානගත කිරීම දරුවාට හෝ වෙනත් අයට හානියක් සිදුකිරීමට ඉඩ ඇති බවට විශ්වාස කරන්නේ නම් පාසැල් දිස්ත්‍රික්කයට නිසි ක්‍රියාදාම නඩු විභාගයක් ඉල්ලා අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ගොනු කර සිටීමට හැකිය (ඉහත බලන්න):

පරිපාලන නීති විනිසුරු අධිකාරිය
උප-මාතෘකාව යටතේ විස්තර කර ඇති අවශ්‍යතාවන් සැපිරූ *ALJ* වරයෙකු **අපක්ෂපාතී පරිපාලන නීති විනිසුරු**, නිසි නඩු විභාගයක් පවත්වා තීරණයක් ගත යුතුය. *ALJ* ට හැකියාව ඇත්තේ:

1. **පාසල් කාර්ය මණ්ඩලයේ බලතල**, ශීර්ෂය යටතේ විස්තර කර ඇති අවශ්‍යතාවයන් උල්ලංඝනය කිරීමක් මගින් ඉවත් කිරීම සිදු කර ඇති බව හෝ දරුවාගේ හැසිරීම දරුවාගේ ආබාධිතාව පිළිබිඹු කරන්නක් බවට *ALJ* තීරණය කලහොත් පෙර ස්ථානයට ශිෂ්‍යයා නැවත ස්ථානගත කිරීම, හෝ¦
2. දරුවාගේ වර්තමාන ස්ථානගත කිරීම පවත්වාගෙන යාම තුලින් දරුවාට හෝ අනිකුත් අයට තුවාල සිදුවිය හැකි බව *ALJ* විසින් තීරණය කරනු ලද්දේ නම්, පාසැල් දින 45 කට නොඅඩු සුදුසු තාවකාලික විකල්ප අධ්‍යාපනික වටාපිටාවක් වෙත ආබාධිත දරුවාගේ ස්ථානයේ වෙනසක් කිරීමට විධාන කිරීම.

දරුවා නැවත මුල් ස්ථානය වෙතට පැමිණීම මගින් දරුවාට හෝ අනිකුත් අයට හානියක් සිදු වනු ඇති බවට පාසල් දිස්ත්‍රික්කය විශ්වාස කරයි නම් මෙම විභාග කිරීම් නැවත නැවතත් කළ හැකිය.

දෙමාපියෙකු හෝ පාසල් දිස්ත්‍රික්කය එවැනි නඩු විභාගයක් ඉල්ලා සිටීම සඳහා නිසි ක්‍රියාමාර්ග පැමිණිලි ගොනු කරන සෑම අවස්ථාවකදීම, පහත පරිදි හැර, **අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිලි, අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිලි පිළිබඳ විභාගය පැවැත්වීම**, යන ශීර්ෂයන් යටතේ විස්තර කර ඇති අවශ්‍යතාවන් සපුරාලන පරිදි විභාගය පැවැත්විය යුතුය

1. *MDE* යුහුසුළු නඩු විභාගයක් පැවැත්වීමට කටයුතු කරන විට, නඩු විභාගයක් ඉල්ලා සිටී දින සිට පාසල් දින **20** ක් ඇතුලත එය සිදුවිය යුතුය හා විභාගයට පසුව දින **10** ක් ඇතුලත තීරණය දිය යුතුය.
2. රැස්වීම අතහැර දැමීමට හෝ මැදිහත්වීම භාවිතා කිරීමට දෙමව්පියන් සහ පාසැල් දිස්ත්‍රික්කය ලිඛිතව එකඟ නොවන්නේ නම්, අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ලැබීමෙන් දින **හතක්** ක් ඇතුලත විසඳුම් සඳහා වන හමුවීම් සිදුවිය යුතුය. අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ල ලැබීමෙන් දින **15** ක් ඇතුලත දෙපාර්ශවයම තෘප්තිමත් විසඳුමක් නොලැබුණහොත් විභාගය දිගටම ක්‍රියාත්මක කල හැකිය.

නඩු විභාගයට සම්බන්ධ ඕනෑම පාර්ශවයක් (ඔබ හෝ පාසැල් දිස්ත්‍රික්කය),˜සිවිල් ක්‍රියාකාරකම්, එම ක්‍රියා ගොනු කිරීම සඳහා ගතවන කාල සීමාව ඇතුළත්˜ යන මාතෘකාව යටතේ විස්තර කර ඇති පරිදි සිවිල් ක්‍රියාමාර්ගයක් ගෙන ඒමට ක්‍රියා කලේ නැතිනම් කඩිනම් ක්‍රියා පටිපාටි විභාගයකින් ඉක්බිතිව ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

## අභියාචනා අතරතුරදී ස්ථානගත කිරීම

**34 *CFR* §300.533**
ඉහත විස්තර කර ඇති පරිදි, දෙමව්පියන් හෝ පාසැල් දිස්ත්‍රික්කය විනය කටයුතු සම්බන්ධ අදාළ ක්‍රියාවලි සඳහා වන පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති විට, විභාග කරන නිලධාරියාගේ තීන්දුව ලැබෙන තෙක් (දෙමව්පියන් සහ *MDE* හෝ පාසැල් දිස්ත්‍රික්ක වෙනත් ආකාරයකින් එකඟ නොවේ නම්) නැතහොත්, ˜පාසල් කාර්ය මණ්ඩලයේ බලතල˜ මාතෘකාව යටතේ විස්තර කර ඇති පරිදි ඉවත් කිරීම සිදු කරන කාල සීමාව ඉකුත්වන තුරු දරුවා තාවකාලික විකල්ප අධ්‍යාපනික වටාපිටාවක සිටිය යුතු අතර, පලමුවන්ම සිදුවන දේ ක්‍රියාත්මක වේ.

## දරුවන්ට ආරක්ෂාව, විශේෂ අධ්‍යාපන හා අදාළ සේවා සඳහා සුදුසුකමක් නොවේ

**34 *CFR* §300.534**

සාමාන්‍ය
විශේෂ අධ්‍යාපන හා අදාළ සේවාවන් සඳහා දරුවකු සුදුසු ද යන්න තීරණය කර නොමැති අවස්ථාවක සිසුවා, පාසල් නීතියක් උල්ලංඝනය කරයි නම්, නමුත් පාසල් දිස්ත්‍රික්කය විනය ක්‍රියාමාර්ගගෙන ඇති අදාළ හැසිරීමට

පෙර දරුවා ආබාධ සහිත දරුවෙකු බව නිශ්චිත කරගෙන සිටියේ නම් (පහත දැක්වෙන පරිදි), දරුවාට මෙම නිවේදනයෙහි විස්තර කර ඇති ඕනෑම ආරක්ෂණයක් ලබාගත හැකිය.

විනය කටයුතු සඳහා අදාළ වන දැනුම් පදනම
විනය ක්‍රියාමාර්ග ගෙන ඇති හැසිරීමකට පෙර දරුවෙකු, ළමා ආබාධයක් ඇති බව අයෙකු බව පාසැල් දිස්ත්‍රික්කය දැන සිටිය යුතුය.

1. දරුවාගේ දෙමව්පියන් විසින් ලිඛිතව දරුවාට විශේෂ අධ්‍යාපනයක් හා අදාළ සේවාවන් අවශ්‍ය බව සුදුසු අධ්‍යාපන ආයතනයක අධීක්ෂණට හෝ පරිපාලන නිලධාරීන්හට හෝ දරුවාගේ ගුරුවරයෙකු අවශ්‍ය බව ලිඛිතව ප්‍රකාශ කර ඇත¦
2. *IDEA* හි බී කොටසෙහි විශේෂ අධ්‍යාපන හා අදාළ සේවාවන් සඳහා සුදුසුකම් ලැබීම සඳහා ඇගයීම් කිරීමට දෙමව්පියන් ඉල්ලා සිටීම¦ හෝ
3. දරුවාගේ ගුරුවරයා හෝ වෙනත් පාසල් දිස්ත්‍රික්ක කාර්ය සේවකයෙකු, දරුවා විසින් පෙන්නුම් කරන හැසිරීම් රටාවක් පාසල් දිස්ත්‍රික්කයේ විශේෂ අධ්‍යාපන අධ්‍යක්ෂකට හෝ පාසලේ වෙනත් අධීක්ෂණ කාර්ය මණ්ඩල නිලධාරියෙකුට සෘජුවම ප්‍රකාශ කිරීම.

ව්‍යතිරේකය
පාසැල් දිස්ත්‍රික්කයක් හට එවැනි දැනුමක් තිබිය යුතු යැයි සලකනු නොලැබේ:

1. දරුවාගේ දෙමව්පියකු දරුවාගේ අගැයීම හෝ විශේෂ අධ්‍යාපන සේවාවන් ප්‍රතික්ෂේප කර තිබීම¦ හෝ
2. *IDEA* හි බී කොටස යටතේ ආබාධ රහිත දරුවෙකු ලෙස දරුවා ඇගයීමට ලක් කර තිබීම.

දැනුම් පදනමක් නොමැති නම් අදාළ වන කොන්දේසි
දරුවාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රථම, පාසල් දිස්ත්‍රික්කයට දරුවා ආබාධයකින් පෙළෙන බවට **විනය කටයුතු සඳහා දැනුම් පදනම** සහ **ව්‍යතිරේක** යන උප මාතෘකා යටතේ විස්තර කරන පරිදි දැනුමක් නැතිනම්, ආබාධ රහිත සම හැසිරීම් ඇති ළමුන්ට ලබාදෙන විනය ක්‍රියා මාර්ගම එම දරුවාටත් අදාළ වේ.

කෙසේ වෙතත්, දරුවා විනය ක්‍රියාමාර්ගවලට යටත් වන කාලය තුළ දරුවාගේ ඇගයීම සඳහා ඉල්ලීමක් කරනු ලැබුවහොත්, එම කාර්යය කඩිනමින් සිදු කළ යුතුය.

ඇගයීම අවසන් වන තුරු දරුවාගේ අධ්‍යාපන ස්ථානගත කිරීම අධ්‍යාපන බලධාරීන් විසින් තීරණය කරනු ලබන අතර අධ්‍යාපන සේවා අත්හිටුවීම හෝ නෙරපා හැරීම එයට ඇතුළත් විය හැකිය.

දරුවා ආබාධ සහිත දරුවෙකු බව නිශ්චිත කරගෙන සිටී නම් පාසල් දිස්ත්‍රික්කය විසින් පවත්වන ලද ඇගයීමක තොරතුරු සහ දෙමාපියන් විසින් සපයන ලද තොරතුරු සැලකිල්ලට ගනිමින්, පාසැල් දිස්ත්‍රික්කය *IDEA* හි බී කොටස අනුව විශේෂ අධ්‍යාපන හා අදාළ සේවාවන් සැපයිය යුතුය.

## පොලීසිය සහ අධිකරණ බලධාරීන් විසින් යොමු කිරීම හා ක්‍රියා කිරීම

**34 *CFR* §300.535**
*IDEA* හි බී කොටස පහත දෑ නොකරයි:

1. සහභාගී වන ආයතනයක් ආබාධ සහිත දරුවෙකු විසින් කළ අපරාධයක් අදාළ ආයතන වලට වාර්තා කිරීම තහනම් කිරීම; හෝ
2. ආබාධ සහිත දරුවෙකු විසින් සිදු කරන ලද අපරාධවලට ෆෙඩරල් හා රාජ්‍ය නීති යෙදීම සම්බන්ධව සිය වගකීම් ඉටු කිරීමට රාජ්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමෙන් අධිකරන බලධාරීන් වැළැක්වීම.

වාර්තා සම්ප්‍රේෂණය කිරීම
ආබාධ සහිත දරුවෙකු විසින් සිදු කළ අපරාධයක් පාසැල් දිස්ත්‍රික්කයක් වාර්තා කරයි නම්, පාසැල් දිස්ත්‍රික්කය:

1. දරුවාගේ විශේෂ අධ්‍යාපන සහ විනය වාර්තා සලකා බැලීම සඳහා ආයතනය විසින් අපරාධ වාර්තා කරන බලධාරීන් වෙත එම වාර්තා සම්ප්‍රේෂණය කලයුතු වේ; සහ
2. දරුවාගේ විශේෂ අධ්‍යාපන හා විනය වාර්තාවල පිටපත් යැවිය හැක්කේ *FERPA* විසින් අනුමත කළ ප්‍රමාණයට පමණි.

## මහජන වියදමින් පෞද්ගලික පාසල්වල දරුවන්ගේ දෙමව්පියන් විසින් ඒකපාර්ශවිකව ස්ථානගත කිරීම් සඳහා වන අවශ්‍යතා

### සාමාන්‍ය

**34 *CFR* §300.148**
පාසල් දිස්ත්‍රික්කය ඔබගේ දරුවාට *FAPE* ලබා දුන් නමුදු ඔබ විසින් ආබාධිත දරුවා පුද්ගලික පාසලක ස්ථාපනය කිරීමට තොරා ගත් කළ, *IDEA* හි බී කොටසට අනුව විශේෂ අධ්‍යාපනය සහ අදාළ සේවාවන් ඇතුළුව අධ්‍යාපනික වියදම සඳහා පාසල් දිස්ත්‍රික්කයක ගෙවීම් කල යුතු නැත. කෙසේවෙතත්, දෙමාපියන් විසින් පුද්ගලික පාසල් වලට යොමුකළ දරුවන් පිලිබඳ බී කොටසේ 34 *CFR* §§300.131 සිට 300.144. දක්වා එන ප්‍රතිපාදන මගින් නියාමනය කෙරන විශේෂ අවශ්‍යතා ඇති ඔබගේ දරුවා අයත් ගහනය පුද්ගලික පාසල අයත්වන පාසල් දිස්ත්‍රික්කය මගින් අඩංගු කල යුතුය.

පෞද්ගලික පාසල් ස්ථාපනය සඳහා ප්‍රතිපූරණ දීමනාව
ඔබගේ දරුවා විශේෂ අධ්‍යාපනයක් සහ අදාළ සේවා පාසල් දිස්ත්‍රික්කය යටතේ පෙරදී ලබා ඇත්නම්, සහ පුද්ගලික පෙර පාසලක, ප්‍රාථමික පාසලක සහ ද්විතීයික පාසලක ඔබගේ දරුවාව අධ්‍යාපනය සඳහා ඇතුලත් කිරීමට තීරණය කළ නමුත් පාසල් දිස්ත්‍රික්කයෙන් ඒ පිලිබඳ නිසි අවසරය ලබා නැත්නම්, පුද්ගලික අංශයේ අධ්‍යාපනය ලැබීමට ලියාපදිංචිය සඳහා වැයවූ මුදල නැවත ලබා දීමට ඒජන්සිය හට නියම කිරීමට උසාවිය හෝ *ALJ* විසින් තීරණය කරනුයේ ඔබගේ දරුවාහට එම ලියාපදිංචියට පෙර කාලානුරූපීව *FAPE* ලබා දීමට ඒජන්සිය අපොහොසත් වීම නිසා පුද්ගලික ස්ථාපනයකට යාමට සිදුවූ බවට සාධක ඇති නම් ය. ස්ථානගත කිරීම *MDE* සහ පාසැල් දිස්ත්‍රික්ක මගින් සපයනු ලබන අධ්‍යාපනය සඳහා අදාළ වන ප්‍රාන්ත ප්‍රමිතිවලට අනුකූලව ස්ථානගත නොවීමක් වුවද, *ALJ* හෝ උසාවියට එය යෝග්‍ය විය හැකිය.

ප්‍රතිපූරණ සීමා කිරීම
ඉහත ඡේදයෙහි විස්තර කර ඇති පිරිවැය ප්‍රතිපූරණය අඩු හෝ ප්‍රතික්ෂේප විය හැකිය:

1. නම්: (ඒ) ඔබගේ දරුවාව රජයේ පාසලෙන් ඉවත් කිරීමට ප්‍රථම පැවැත්වූ *IEP* රැස්වීමේ දී, ඔබගේ දරුවාට *FAPE* ලබාදීමට පාසල් දිස්ත්‍රික්කය යෝජනා කල ස්ථාපනය ප්‍රතික්ෂේප කල නමුත් *MDE* කණ්ඩායමට දැනුම් දුන්නේ නැතිනම්, ඔබගේ අවශ්‍යතාව වන්නේ මහජන වියදමින් පුද්ගලික පාසලකට දරුවාව ඇතුලත් කිරීමට නම් එයද දැනුම් දුන්නේ නැතිනම්¦ හෝ (බී) රජයේ පාසලකින් ඔබගේ දරුවා ඉවත් කරගැනීමට පෙර අඩුම තරමින් ව්‍යාපාරික දින 10ක් ඇතුලත (ව්‍යාපාරික දින අතරමැද ඇති නිවාඩු ද ඇතුලත්ව), ඔබ ලිඛිත දැනුම් දීමක් පාසල් දිස්ත්‍රික්කයට නොකළේ නම්
2. රජයේ පාසලෙන් ඔබේ දරුවා ඉවත් කිරීමට පෙර, ඔබේ දරුවා ඇගයීමට ලක් කිරීමට අදහස් කර ඇති බවට පාසැල් දිස්ත්‍රික්කය පූර්ව ලිඛිත දැනුම් දීමක් ලබා දුන්නේ නම්, (සුදුසු හා සාධාරණ අගැයීමේ කාර්යය ප්‍රකාශය ක් ඇතුළුව), නමුත් ඔබ ඇගැයීම සඳහා දරුවා ලබා නොදුන්නේ නම්¦ **හෝ**
3. ඔබගේ ක්‍රියාවන් අසාධාරණ බව උසාවිය සොයා ගැනීම.

කෙසේ වෙතත්, ප්‍රතිපූරණ පිරිවැය:

1. දැනුම්දීම ලබා දීමට අසමත් වීම නිසා අඩු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොකල යුතුය: (ඒ) පාසල විසින් ඔබ දැනුම් දීම වැළැක්වීම (බී) ඉහත සඳහන් කර ඇති දැනුම්දීම සැපයීමට, ඔබේ වගකීම පිලිබඳ දැනුම්දීමක් ඔබ වෙත ලැබුණේ නැතිනම්¦ හෝ (සී) ඉහත අවශ්‍යතාවන්ට අනුකූල වීමෙන් ඔබේ දරුවාට ශාරීරික හානියක් සිදුවිය හැකි නිස¦ සහ
2. උසාවියේ හෝ *ALJ* ගේ අභිමතය පරිදි, අවශ්‍ය කරන දැනුම්දීම ලබා දීමට දෙමව්පියන් අපොහොසත් වීම නොසැලකීම හෝ ප්‍රතික්ෂේප නොකල හැකිය. (ඒ) දෙමව්පියන් ඉංග්‍රීසි නොදත් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ලිවිය නොහැකිය¦ හෝ (බී) ඉහත අවශ්‍යතාවන්ට අනුකූල වීම හේතුවෙන් දරුවාට බරපතල මානසික හානියක් සිදුවිය හැකිය.

## වයොපූර්ණත්වයේ දී පරම අයිතිය හුවමාරු කිරීම

**34 *CFR* §300.520**
ආබාධ සහිත සිසුවෙකු වැඩිහිටි වයසට එළැඹුනු විට, (මිචිගන්හි නීත්‍යානුකූල භාරකරුවෙකු පත් කර නොමැති නම් වයස අවුරුදු 18 දී) *IDEA* හි බී කොටස යටතේ අවශ්‍ය දැන්වීම් පොදු ඒජන්සිය විසින් ශිෂ්‍යයා සහ මව්පියන් යන දෙදෙනාටම ලබා දිය යුතුය සහ *IDEA* හි බී කොටස යටතේ දෙමව්පියන්ට ලබාදුන් සියලු අයිතිIEEවාසිකම් පිලිබඳව සිසුවාට යැවිය යුතුය. දෙමව්පියන්ට ලබාදුන් සියලු අයිතිවාසිකම් පිලිබඳ තොරතුරු වැඩිහිටි හෝ වැඩිහිටි ෆෙඩරල්, ප්‍රාන්ත හෝ, ප්‍රාන්ත හෝ ප්‍රාදේශීය පුනරුත්ථාපන ආයතන වල ශිෂ්‍යයන් හටද යැවිය යුතුය.

## ඇමුණුම් ඒ - ෆෙඩරල් අර්ථ දැක්වීම්

### බරපතළ තුවාල

**18 *USC* 1365(*h*)**

3. ˜බරපතළ තුවාල˜ යනු ශරීරයේ තුවාල සිදුවීමයි
   - (A) සැලකිය යුතු මරණ අවදානමක්¦
   - (B) අධික ශාරීරික වේදනාවක්¦
   - (C) බොහෝ කල් ගතවන විරූපවීම හෝ
   - (D) ශරීරයේ කොටසක හෝ අවයවයක හෝ මනසේ දිගුකාලීන හානිය හෝ අපහායනය¦ හා
4. ˜කායික හිංසනය˜ යනු -
   - (A) කැපීම, සීරීම, තැල්ම, දැවීම හෝ විරූපවීම¦
   - (B) ශාරීරික වේදනාව¦
   - (C) අසනීපය¦
   - (D) ශාරීරික කොටසක, අවයවයක හෝ මානසික පීඨයේ ක්රියාකාරිත්වය දුර්වල වීම¦ හෝ
   - (E) කෙතරම් තාවකාලික වුවත් ශරීරයට සිදු වූ වෙනත් තුවාලයක්.

ආයුධය
18 *USC* 930(*g*)

(2) ˜භයානක ආයුධ˜ යනු ආයුධයක්, උපකරණයක්, මෙවලමක්, ද්රව්යයක් හෝ වස්තුවක්, සජීවී හෝ, අජීවී, භාවිතා කිරීමට හැකි හෝ භාවිතා කිරීමෙන් මරණයට හෝ බරපතළ තුවාල වලට හේතු විය හැකි දේවල්ය. දිගින් අගල් 2 1/2ට අඩු සාක්කු පිහි මෙයට අයත් නොවේ.